**මාසික මහ සභා රැස්වීම් වාර්තාව**

| | | |
|---|---|---|
| ස්ථානය | :- | රඹුක්කන ප්‍රාදේශීය සභාව |
| දිනය | :- | 2026.04.07. |
| වේලාව | :- | පෙ.ව. 10.00 |

**සහභාගිත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදූ සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
14. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
15. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
16. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
17. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
18. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
19. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
20. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
21. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
22. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
23. පී.ජී.මල්ලිකා මැතිතුමිය
24. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
25. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
26. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
27. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
28. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
29. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
30. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
31. එච්.ආර්.ප්‍රදිපා රංජනී මැතිතුමිය
32. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
33. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
34. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
35. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
36. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහාභාගිත්වය**

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ).i. 2026.03.04 දින පැවැති මාසික මහසභා වාර්තාව සම්මත කිරීම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026.03.04 දින පැවැත්වූ මාසික මහසභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2026.03.04 දින පැවැත්වූ මාසික මහසභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**සංශෝධන**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පිටු අංක 25 හි සඳහන් ඊ.07.ii යෝජනාව ඒකමතිකව සභා සම්මත විය ලෙස සටහන් වී ඇති නමුත් එම යෝජනාව සභා සම්මත නොවූ බැවින් එය ඉවත්විය යුතු බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.
පිටු අංක 27 හි සඳහන් ඊ.01.II.04 යෝජනාවේ ගෙනුක පිල්වර්ස් ලෙස සටහන් වුවද එය ගෙනුක බිල්ඩර්ස් විය යුතු බවත්, තීරණයේ ද එය වෙනස් විය යුතු බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඊ.02.II යෝජනාව අතරතුර මාසික සභික දීමනා බෙදීම සිදු වූ බවත් එහිදී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා සහ ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමාගේ සභික දීමනාව නොලැබූ බැවින් ඒ සම්බන්ධව ප්‍රශ්න නැගූ බවත් ඉන් අනතුරුව සභා ගර්භයෙන් ඉවත්ව ගිය බවත් එය වාර්තාවේ සටහන් වී නොමැති බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

පිටු අංක 12 හි සඳහන් සභාපතිතුමන්ගේ xiii වන යෝජනාව සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ප්‍රථම එන්.ඒ.ප්‍රේමදාස මහතාට මේ සම්බන්ධව ලිපියකින් දැනුම් දීම සිදුකළ යුතු බව ප්‍රකාශ කළ බවත්, එය වාර්තාවේ සඳහන් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. එසේම ඒකමතිකව සභා සම්මත විය යන්න යෙදීම සුදුසු නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026.03.04 දිනැති මහසභා වාර්තාව ඉදිරිපත් කර ඇති සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව 2026.03.04 දිනැති මහසභා වාර්තාව ඉදිරිපත් කරන ලද සංශෝධන යටත්ව සභා සම්මත විය.

පෙ.ව.10.16 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර යන මන්ත්‍රීවරුන් මහසභාව වෙත පැමිණෙන ලදී.

**(අ). ii. 2026.03.17 දින පැවැති විශේෂ මහසභා වාර්තාව සම්මත කිරීම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026.03.17 දින පැවැත්වූ විශේෂ මහසභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2026.03.17 දින පැවැත්වූ විශේෂ මහසභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද අතර එම විශේෂ මහසභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව 2026.03.17 දින පැවැත්වූ විශේෂ මහසභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිත සභා සම්මත වූ බවට ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ ගරු සභාවට ප්‍රකාශ කරන ලදී.

**(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදනය.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

01. 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත ප්‍රකාරව 2025 වර්ෂයට අදාළව වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් 2026.03.31 දින අංක CIG/AD/1/8/7/01 දරණ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.මල්ලිකා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.සී.සිසිර කුමාර
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර යන මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා හැකි ඉක්මනින් තම වත්කම් බැරකම් ප්‍රකාශ ලේකම්තුමාට භාර දෙන ලෙස දන්වා සිටින ලදී.

02. ප්‍රාදේශීය සභා සභිකයින්ට ගෙවනු ලබන වියදම් දීමනාව සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් 2026.03.16 දින අංක CLG/AD/1/8/1/3 දරණ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. එම ලිපියෙහි පිටපතක් සෑම සභිකයකුටම ලැබීමට සලස්වන ලදී. ඒ අනුව පනතේ ලිඛිත නියමයන්ට පට හැනිව කිසිදු ගෙවීමක් හෝ දීමනාවක් ලබා ගැනීමට නීතිමය අවසරයක් නොමැති බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

03. 2026.01.30 දින පළාත් පාලන කොමසාරිස් විසින් එවන ලද ලිපිය සභාවට ඉදිරිපත් කළ අතර එහි සඳහන් පරිදි රැස්වීම් අවස්ථාවන්ට නොපැමිණි සභික මහත්ම මහත්මීන් හත්දෙනෙකුට සභික දීමනා ගෙවීම සම්බන්ධ චෝදනාවක් සිදුකර ඇති බවත් මෙවැනි චෝදනා ඉදිරියේදී සිදු නොවීමට වග බලාගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. තවද, විගණන ආයතනය විසින් ඊට හේතු විමසා ලිපියක් එවා ඇති බවත්, ඊට පිළිතුරු ලෙස නීතිමය තත්ත්වය පිළිබඳ විෂය නිලධාරීන් දැනුවත් කළ බව දන්වා විගණනයට පිළිතුරු යැවූ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මන්ත්‍රීවරු යනු කම්කරුවන් නොවන බවත්, ගරු සේවාවක් කරන අය බවත්, චක්‍රලේඛන නිකුත් කර එම සේවාව හෑල්ලුවට ලක් නොකළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2005 ගැසට් පත්‍රය සභාවට නැවත ඉදිරිපත් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

සභික දීමනාව ගිය මාසයේද ලබා නොගත් බවත්, සභා රැස්වීමට නොපැමිණි විට වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කළ විට දීමනාව ලබාගත හැකි බව ප්‍රකාශ වන බවත්, නව රජය පත්කළේ සොරුන් ඇල්ලීමට මිස සොරකම් කිරීමට නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වෛද්‍ය හේතුන් මත පමණක් සභා රැස්වීමකට නොපැමිණ සිටීමට අවසර පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කමිටු රැස්වීම් වලට පැමිණීමට නොහැකි නම් සභා යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා**

මුදල් කමිටුවට මසකට හතර වතාවක් පැමිණිය නොහැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

04. රඹුක්කන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්.එම්.සමන්ත රණසිංහ මහතා විසින් 2026.03.27 දිනැති අංක PCO/RMB/PS/18/01/2026 දරණ ලිපියෙන් ඉදිරිපත් කරන ලද

ප්‍රාදේශීය සභාවේ භාවිතා නොකළ හෝ ඌණ උපයෝගීතා ඉඩම් සම්බන්ධ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

**(ඈ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමාගේ නිවාඩු ලබා ගැනිම පිළිබඳ නිවේදන ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ගරු සභාවට යෝජනා කරන ලදි. සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. අසනිප බැවින් 2026.04.07 දින පැවැත්වෙන මහසභාවට සහභාගි විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහසභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2026.04.07 දින පැවැත්වෙන මහසභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමාට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබාදිම සුදුසු බවට ගරු මහසභාව විසින් අනුමත කරන ලදි.

**(ඇ).සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම -නැත**

**(ඉ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න**

01. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කරන ලදී.**

**1.1. 2025.12.26 දින සිට ඇති වූ සුළි කුණාටුව නිසා රටේ විශාල දේපළ ප්‍රමාණයක් හානියට පත්විය. ඒ අනුව ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග සහ ස්ථාන කීයක් හානි වී ඇත්ද?**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාර්ග 106 ආපදා වු බවට වාර්තා වු බවත්, පසු විපරමින් පසු මාර්ග 74 ක් හඳුනා ගත් බවත් ප්‍රකාශ කරන ලදී.

**1.2. ඒවා තාවකාලිකව ප්‍රතිසංස්කරණය කළාද?**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තාවකාලිකව ප්‍රතිසංස්කරණය කළ බවත්,නමුත් එය දීර්ඝ කාලයක් පවතීද යන්න පිළිබඳව සහතිකයක් ලබාදිය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. තවද,

- ➢ මාර්ග 42 ක අවහිරතා ඉවත් කළ බවත්,
- ➢ ළිං 30 පමණ අපවිත්‍ර ජලය ඉවත් කර පිරිසිදු කළ බවත්,
- ➢ පානීය ජල අවශ්‍යතාවය සඳහා ජල බවුසර් 28 ක් පමණ සැපයූ බවත්,
- ➢ ගලි සේවා 12 ක් පමණ සැපයූ බවත්,
- ➢ පොදු ස්ථාන 52 ක පමණ පිරිසිදු කිරීම් සිදුකළ බවත්,
- ➢ දැඩි හානියට පත් මාර්ග 02 ක් කොන්ක්‍රීට් කර ප්‍රතිසංස්කරණය කළ බවත් ප්‍රකාශ කරන ලදී.

**1.3. ඒ සඳහා වියදම් කළ යුතු මුදල කොපමණද?**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මිලියන 05 ක මුදලක් රඹුක්කන කොට්ඨාසය සඳහා වෙන්කර තිබූ බවත්,රු.3566455.00 ක මුදලක් වියදම් කළ බවත් ප්‍රකාශ කරන ලදී.

**1.4. 2026 වර්ෂය තුළ එම හානියට පත් මාර්ග සහ ස්ථාන ප්‍රතිසංස්කරණය සඳහා වැඩපිළිවෙළක් තිබේද?**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාර්ග 74 ක් පිළිබඳ ජනාධිපති කාර්යාලයට වාර්තා කර පවතින බවත්,

සභාගර්භයේ ඝෝෂා
සභාපතිතුමන් විසින් සමථයකට පත්කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
ඔච්ද නැද්ද යන්න ලෙස කෙටි පිළිතුරක් දිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා
සභාපතිතුමන් විසින් සමථයකට පත් කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මන්ත්‍රීවරුන් වන ඔබලාගේ පිළිතුරු ලබා දීමේ ක්‍රමයට වඩා තමාගේ පිළිකරු දීමේ ක්‍රමය වෙනස් බවත්, පක්ෂ මන්ත්‍රීවරුන් හට ප්‍රශ්න ඇසීමේ අයිතියක් නැතිද යන්නත් විමසන ලදී.

සභාගර්භයේ ඝෝෂා
සභාපතිතුමන් විසින් සමථයකට පත්කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මාර්ග 106 වාර්තා වූ බැවින් 74 ක් හඳුනාගත හැකි වූ බවත්, එම මාර්ග 74 පිළිබඳව තොරතුරු ජනාධිපති කාර්යාලයට වාර්තා කර පවතින බවත්, ඒ අනුව සංවර්ධන කටයුතු ඉදිරියේදී සිදුවිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

**(ඊ).01.I.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

i. **මෙම සභාව සතු පොදු වෙළෙඳපළ II අදියර කඩ කාමර අංක 01 කඩ කාමරය එම්.ආර්. සිත්ති පවුසුල් විසින් කීමනී හා ගිවිසුම් ඇප මුදල් ද ගෙවා ඇති නමුත් ඇය විසින් අත්සන් කරනු ලබන ගිවිසුමක් ගොනුවේ නැත.නමුත් කඩකුලී ලේඛනයේද මේ වන විටත් පවතිනුයේ එම්.ආර්. සිත්ති පවුසුල් නැමැති ලෙසය. මේ වන විට ඇය මියගොස් ඇති බවත් ,ඇගේ සැමියා විසින් දන්වා සිටින අතර එම කඩ කාමරයේ බදු අයිතිය ඔහුට පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බැවින් එම ඉල්ලීමට තීරණයක් ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ගොනුව පරීක්ෂා කිරීමේ දී මුතාලිෆ් නැමැත්තකු විසින් 2021.01.01 දින සිට පෙර ගෙවුම් මුදල අවස්ථා කිහිපයකදී ගෙවා ඇති බවත්, නමුත් බදු ගිවිසුමක් ඔහු නමින් නොමැති බවත්, 2021 වර්ෂයේ ආදායම් පරීක්ෂක වාර්තා අනුව එම කඩකාමරය සිත්ති ෆවුසි නැමැත්තියක් විසින් පවත්වාගෙන යන බවත්, ඒ අනුව ඇයට එම කඩකාමරය පැවරීම සුදුසු බවත්, යෝජනා වී ඇති බවත්, ඇයද පෙර ගෙවුම් මුදලක් හෝ ගිවිසුම් ඇප ගෙවා ඇති බවත්, කඩ කුලී ලේඛනයේ ඇගේ නම පැවතිය ද දීර්ඝකාලීන ගිවිසුමක් නොමැති බවත්, 2021.08.10 දින මහසභා අනුමැතිය ලැබී ඇති බවත්, මේ වන විට ඇය මියගොස් ඇති බව සැමියා විසින් දන්වා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
විවාහ සහතිකය ලබාගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ජේ.එස්.කරුණාරත්න මැතිතුමා**
ගිවිසුමක් නොමැති වීම මත අයිතිය පැවිරීම සම්බන්ධව ඉදිරියේදී ගැටළු ඇතිවිය හැකි බැවින් අදාළ ගොනුව පරීක්ෂා කළ යුතු බවත්, 2021 ද පෙර ගෙවුම් මුදල් ගෙවීම සම්බන්ධව මහසභා අනුමැතිය ලබාගෙන තිබේ

නම් පැවරීම කිරීම සම්බන්ධව ගැටලුවක් නොමැති බවත්, එසේ මහසභා අනුමැතිය ලබාගෙන නොමැති නම් පැවරීම් කිරීම ගැටළු සහගත බව තමාට වැටහෙන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
- ➢ විවාහ සහතිකය
- ➢ මරණ සහතිකය
- ➢ ස්වාමිපුරුෂයාගේ ජාතික හැඳුනුම්පතේහී ඡායා පිටපත් ආදිය නීතිමය ලියවිලි ඉදිරිපත් කර ඇති බවත්, අංක 77, හුරීමළුව, රඹුක්කන ලිපිනයේ පදිංචිකරුවකු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
කඩ කාමරය සම්බන්ධ දිගුකාලීන ගිවිසුමක් නොමැති වීම පෙර පැවති ගැටළුවක් බවත්, (පැවරීමට විරුද්ධත්වයක් නොමැති නම්) නීතිමය ලියවිලි හා ලිපිගොනුව ගැටළු සහගත නැතිනම් මහසභා අනුමැතිය ලබාදීම සුදුසු බව යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
2021/08/21 මහසභා අනුමැතිය ලබාගෙන සිත්ති මහත්මියට ලබාදීම සිදුකර ඇති බවත්, අදාළ නීතිමය ලියවිලි ඉදිරිපත් කර ඇති බවත් නැවතත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
බිරිඳ මියගිය අවස්ථාවක ස්වාමිපුරුෂයා නැවත විවාහයක් සිදුකරගෙන තිබෙන විටකදී මියගිය බිරිඳගේ දේපළවල අයිතිය පැවරීමේදී නීතිමය ගැටළුවක් පවතින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
බිරිඳ මියගිය විට නැවත විවාහයක් කර ගැනීමට නීතිමය බාධාවක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම පොදු වෙළඳපල II අදියර කඩකාමර අංක 01 හි අයිතිය පැවරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලදී.

බෙදීමක අවශ්‍යතාවය පැන නොගැනී හෙයින් අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
පොදු වෙළෙඳපල II අදියර අංක 01 කඩ කාමරයේ බදු අයිතිය පැවරීමට අදාල නීතිමය ලියවිලි ඉදිරිපත් කර ඇති බැවින් එම්.ආර්.සිත්ති පවුසල් මහත්මියගේ සැමියා වන සරිප්දීන් රිස්වින් මහතාට පවරා දීමට තීරණය විය.

ii. **රඹුක්කන ප්‍රාදේශීයේ සභාව වෙත 2016/08/22 වන දින ඔප්පු අංක 1796 යටතේ ගොඩගම්පල මෛත්‍රී සුභසාධක හා අවමංගල්‍යාධාර සමිතියට රැස්වීම් ශාලාවක් ඉදිකිරීම පිණිස පර්චස් 2.8 ක ඉඩම් කොටසක් ලබා දී ඇත. නමුත් මේ වන විට මෙම ගොඩගම්පල මෛත්‍රී සුභසාධක අවමංගල්‍යාධාර සමිතියට අදාළ සමිති ශාලාව වෙනත් ඉඩමක ඉදිකර එම සමිතිය පවත්වාගෙන යයි. එම කරුණ මත මෙම පර්චස් 2.8 ක ඉඩම් කොටස එස්.පී.එස් ජයසිංහ හා එස්.පී.අමරසේන යන අය නැවත ඉල්ලීම් කරයි. එම ඉල්ලීම සඳහා තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ඔප්පු අංක 1796 යටතේ මෙම බිම් කොටස ලබාදී ඇත්තේ ගොඩගම්පල මෛත්‍රී සුභසාධක හා අවමංගල්‍යාධාර සමිතියට රැස්වීම් ශාලාවක් ඉදිකිරීමට බවත්, එම කාර්ය වෙනත් භූමියක ඉදිකර රැස්වීම්

ශාලාවකින් සිදුවන බැවිනුත් අදාළ දේපළ සභාව භාරයේ තබා ගැනීම ඵල රහිත බැවිනුත් නැවත ඒ.පී.එස්.ජයසිංහ හා එස්.පී.අමරසේකර යන අයට පවරාදීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලදී.

බෙදීමක අවශ්‍යතාවය පැන නොගැනී හෙයින් අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
ගොඩගම්පල මෛත්‍රී සුභසාධක හා අවමංගල්‍යාධාර සමිතියට රැස්වීම් ශාලාවක් ඉදිකිරීම පිණිස මෙම බිම් කොටස ලබා දී තිබුණත්, එම සමිති ශාලාව වෙනත් ඉඩමක ඉදිකර ඇති බැවින් හා ඵලදායී වෙනත් කාර්යක් සඳහා යෙදවිය නොහැකි බැවින්ද එම පර්චස් 2.8 ක ඉඩම් කොටස එස්.පී.එස් ජයසිංහ හා එස්.පී.අමරසේන යන අයගේ ඉල්ලීම මත නැවත ලබාදීමට තීරණය විය.

**iii. බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණයේ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමට හා ඒ සඳහා සභා අරමුදල් වැය දැරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ගිනිවීමේ ඒකකයෙන් අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා ගැනීමට අපේක්ෂිත බවත්, මහසභා අනුමැතිය ලැබීමෙන් අනතුරුව ඇස්තමේන්තුවත් සකස් කරන බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතික සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ගිනි ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට තීරණය විය.

**iv. මෙම සභාව සතු, සභා ගොඩනැගිල්ලේ බිම් මහලේ වම්පස පිහිටි සී/ස කිණිගොඩ කෝරලේ සමූපකාර ඉඩම් උගස් බැංකු පරිශ්‍රය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරුවක් ලබා ගැනීමට අප කටයුතු කළ අතර 2026.03.19 වන දින මාසිකව රු.150,000.00 ක තක්සේරු මුදලක් ලබා ගැනීමට තක්සේරු වාර්තාවක් අප වෙත ලැබී ඇත. එහෙයින් එම ආයතනයට නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට හා ක්‍රියාත්මක කරනුයේ කවරදා සිටද යන්න තීරණය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා**
තක්සේරු වාර්තාව පදනම්ව බදු දිය යුතු නැති බවත්, මහසභා තීරණයකින් අදාළ බදු මුදල තීරණය කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
වෙළෙඳපල ඉල්ලුම පවතින බැවින් රු.175,000.00 ක මුදලකට යාම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
සි/ස කිණියගොඩ කෝරලේ සමූපකාරයේ ඉඩම් උගස් බැංකුව හා ගිවිසුම්ගත වන විට වරින් වර වෙනස් වන තක්සේරු වටිනාකම ගෙවීමේ පදනම මත ගිවිසුම්ගත වීමට මහසභා අනුමැතිය ලබා දුන් බවත්, වැඩි මුදලකට යාමට ගොස් මෙම මුදල ද නොලැබී යාමට ඉඩ ඇති බැවින් තක්සේරුව පදනම් කරගෙන යාම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ජාතික ඉතිරි කිරීමේ බැංකු පරිශ්‍රය සඳහා ද ලැබී ඇත්තේ මෙම අගය බවත්, වැඩි මුදලක් අය කිරීමට පදනමක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
පෙර පැවැති අගයත් නව තක්සේරු අගයත් සඳහන් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
පෙර පැවතියේ රු.105,000.00 බවත්, නව තක්සේරු අගය රු.150,000.00 ක් බවත් රු.45,000.00 ක වැඩිවීමක් ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
අප්‍රේල් මස 01 දින සිට නව තක්සේරුව ක්‍රියාත්මක කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අදාළ යෝජනාව අනුව මාසික නව තක්සේරුව මුදල වන රු.150,000.00 ක මුදල අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාවයක් නොමැති බැවින් අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතික සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
මෙම සභාව සතු, සභා ගොඩනැගිල්ලේ බිම් මහලේ වම්පස පිහිටි සී/ස කිණිගොඩ කෝරළේ සමූපකාර ඉඩම් උගස් බැංකු පරිශ්‍රය සඳහා නව මාසික තක්සේරු වටිනාකම වන රු.150,000.00 ක වටිනාකම 2026.04.01 දින සිට අය කිරීමට තීරණය විය.

**v. පින්නවල රථගාල අසල පොදු වැසිකිළියේ ඇලුමිනියම් ජනේලයේ වීදුරුව බිඳීම හා ඇලුමිනියම් දොරෙහි දොර අඟුළු කඩා ඇති අතර ඒවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා යන වියදම රු.20,578.17 වන අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
පොදු දේපළ පනත අනුව අලාභයේ අගය රු.25,000.00 ට වැඩි දින 14 ක් අලාභය හේතුවෙන් රාජකාරී සිදු කළ නොහැකි අවස්ථාවකදී පොදු දේපළකට අලාභ හානි කිරීම වෙනුවෙන් නඩු පැවරිය හැකි බවත්, මෙම වැසිකිලි පද්ධතියට සිදුකර ඇති අලාභය ගණනය කිරීමේදී රු.20,578.17 ක තක්සේරුවක් ලබා දී ඇති බැවින් පොදු දේපළ පනතට අනුව නඩු පැවරිය නොහැකි වූ බවත් පොලිසිය මැදිහත් වී සේවක මහතාට පහරදීම, දේපළ වලට අලාභ හානි කිරීම හා රාජකාරියට බාධා කිරීම යන කරුණු තුන පදනම් කර නඩුවක් ගොනු කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
මෙම පොදු දේපලට අලාභ හානි කිරීම හා එහි සේවයේ යෙදී සිටි සේවක මහතාට පහරදීම හේතුවෙන් අධිකරණයේ මේ වන විට නඩු කටයුත්තක් ක්‍රියාත්මකව පවතින බවත්, මෙම ඇස්තමේන්තු මුදල වන රු.20,578.17 අදාළ විත්තිකාර පාර්ශවයෙන් ලබා ගැනීමට සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
රජයේ දේපළ සඳහා අලාභ හානි කිරීම සම්බන්ධව එම පුද්ගලයා ගෙන් මුදල් අය කරගත යුතු බවත්, පොදු දේපළ පනත අනුව නඩු පැවරිය හැක්කේ රු.25,000.00 ට වැඩි දේපළ අලාභ හානි වෙනුවෙන් පමණක් බව සමාජ ගත වුවහොත් ඉන් වැරදි අර්ථකථනයක් සමාජගත විය හැකි බවත්, අලුත්වැඩියාව සිදු කරන ගමන්ම නඩු කටයුත්තකට යාම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔහුගේ එම මුදල අයකර ගැනීමට අධිකරණ අවශ්‍යතාවය මත මෙම ඇස්තමේන්තුව සකස් කළ බවත්, නඩුවක් ගොනුකළ නොහැකි බව ප්‍රකාශ නොකළ බවත්, පොදු දේපළ පනතට අනුව නඩුවක් ගොනු කිරීමට අදාළ නීතිමය අවශ්‍යතා සපුරා නොමැති බව ප්‍රකාශ කළ බවත්, චූදිතයාට එරෙහිව නඩුවක් ගොනුකර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

අදාළ පොදු දේපළ අලාභ හානි කිරීම සම්බන්ධව චූදිතයාගෙන් මෙම මුදල අය කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පොදු දේපළ පනත අනුව බැරි නම් සිවිල් නඩුවක් හෝ ගොනු කළ යුතු බවත්, අදාළ චූදිතයාගෙන් මෙම මුදල අයකර ගත යුතු බවත්, නඩු කටයුත්තක් පවතීද්දී එම දේපළ අලුත්වැඩියා කිරීම සඳහා සභාවේ මුදල් වෙන් කිරීම කළ නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

මෙම සිදුවීම සම්බන්ධව උසාවියේ නඩුවක් පවතින බව සභාපතිතුමන් ප්‍රකාශ කළද අලාභ හානිය සම්බන්ධව ඇස්තමේන්තුවක් සකස් කර ඇති අතර එම ඇස්තමේන්තුව සකස් කළේ කවුරුන් විසින්ද යන්න විමසන ලද අතර උසාවි නියෝගයක් නොමැතිව තක්සේරුවක් සිදුකළ නොහැකි බවත්, මේ සම්බන්ධව නඩුවක් පවරා තිබෙන බව පැවසුවද නඩුව සම්බන්ධව මේ මොහොත වන තෙක් දැනුවත් නොවූ බවත්, මහජන මුදලින් පිළිසකර කිරීම සිදුකළ ද අදාළ වියදම් එම අලාභ හානිය සිදුකළ පුද්ගලයාගෙන් ලබාගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කාර්මික නිලධාරි විසින් උසාවි නියෝගය මත මෙම තක්සේරුව ලබාදුන් බවත්, සංචාරක කලාපයක පවතින බැවින් හා එම ස්ථානයට අත්‍යාවශ්‍ය රජයේ දේපළක් වන බැවිනුත් කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය මත මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

සභා යෝජනාවක් මඟින් සමථ මණ්ඩලයක් හරහා මෙම මුදල අදාළ පුද්ගලයාගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

අලාභ හානිය සිදුකළ පුද්ගලයා සමඟ සමථ වීමට සමථ මණ්ඩලයේදී නොහැකි වූ බවත්, ඔහුට විරුද්ධව නඩු පැවරුවාට ඔහුට ගැටළුවක් නොමැති තැන ඔහු සිටින බවත්, පොදු දේපළ පනතට අනුව ඔහුට විරුද්ධව නඩු පැවරීමට නොහැකි නම් ගතහැකි විකල්පය කුමක් දැයි විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නිවැරදි කිරීමක් කළ යුතු බවත්, පොදු දේපළ පනත යටතේ නඩු කීමට නොහැකි බව තමා අදහස් නොකළ බවත්, සමාජ මතය අනුව පොදු දේපළකට හානි කළහොත් අදාළ පුද්ගලයා දින 14 ක සිර දඬුවම් ලබාදීමට නම් අලාභයේ වටිනාකම රු.25,000.00 ට වැඩි විය යුතු බව මහසභාවට ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

මේ සම්බන්ධව නඩුවක් පවරා තිබේද? ලංකාවේ පවතින උසාවිවල නඩු සම්බන්ධව තීන්දු ලබා ගැනීමේදී මාසෙන් දෙකෙන් එය නොලැබෙන බවත්, ඊට වසර 02,03 ක කාලයක් ගතවන බවත් ප්‍රකාශ කරන ලදී. තවද, නඩු කටයුත්ත අවසන් වූ දවසක මෙම මුදල ප්‍රතිපූර්ණය වන අතර විශේෂයෙන්ම විපක්ෂය සහ මහජනතාව සභාව වෙත ඇඟිල්ල දික් කිරීමට මෙය අවස්ථාවක් විය හැකි බැවිනුත් සංචාරක කලාපයෙහි පවතින බැවිනුත් සංවර්ධන කිරීම කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයෙහි ඝෝෂා

- ❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ලංකාවේ පවතින උත්තරීතර අධිකරණ පද්ධතියට විශාල මඩ ප්‍රහාරයක් මෙතුමා එල්ල කළ බැවින් එම ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීවරයකුට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන ලෙස ප්‍රකාශ කරමින් සභාගර්භය සමථ කරන ලදී.

- ❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

විපක්ෂ යන්න ඉල්ලා අස්කර ගන්නා ලෙසත්, මෙම යෝජනාවට විපක්ෂ මන්ත්‍රීන් විරුද්ධ නොවූ බවත් ප්‍රකාශ කරන ලදී.

- ❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

මන්ත්‍රීවරයකු අදහස් ප්‍රකාශ කිරීමේදී ඊට විරුද්ධව අදහස් ඉදිරිපත් කිරීමක් අවශ්‍ය නම් අදාළ මන්ත්‍රීවරයාගේ අදහස් ඉදිරිපත් කිරීමෙන් පසු අවස්ථාවක් ලබාගෙන විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට තරම් සදාචාර සම්පන්න වන ලෙස ප්‍රකාශ කරන ලදී. තවද, මෙම අලාභ හානිය සහා අරමුදලින් පිළිසකර කිරීමටත් හානියට අදාළ මුදල වන්දියක් ලෙස ලබා ගැනීමට නඩු කටයුත්තකට යාමත් සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

- ❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

විපක්ෂය විදිහට සභා දේපළක් ආරක්ෂා කර ගත යුතු බැවින් මෙම යෝජනාවට විරුද්ධ නොවූ බවත්, විශේෂයෙන්ම අධිකරණයට විරුද්ධව මෙතුමා විසින් සිදු කරන ලද ප්‍රකාශ ඉල්ලා අස්කර ගත යුතු බවත්, සභා වාර්තාවෙන් එය ඉවත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යකාව පවතීද යන්න විමසන ලදී.

- ❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

පොදු දේපළ හානි කිරීම සම්බන්ධව ද නැතිනම් සේවක මහතාට පහරදීම හා රාජකාරියට බාධා කිරීම සම්බන්ධව ද නඩුව පවරා ඇත්තේ ප්‍රශ්න කරන ලදී. තවද ,පොදු දේපළ හානි කිරීම යටතේ නඩු පවරා නැතිනම් මෙම මුදල සම්බන්ධයෙන් සභික මණ්ඩලයම වගකිවයුතු වන බව නැවත නැවතත් ප්‍රකාශ කරන ලදී.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පොදු දේපළට හානි කළහොත් සිරගත කිරීමක් කරන බවත් ප්‍රකාශ කරන ලදී. අදාළ ගැටළුව සිදුවූ අවස්ථාවේදී අදාළ පුද්ගලයා හා සමථ වීම සඳහා සමථ මණ්ඩලයකට ගිය බවත්, නමුත් එහිදී ඔහු සමථ නොවූ බවත්, ඒ හේතුවෙන් පොලිසිය විසින් නඩුවක් ගොනු කළ බවත්, එම නඩු කටයුත්තට උසාවි අවශ්‍යතාවය මත අලාභය තක්සේරු කළ බවත්, දසනායක මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කළ පරිදි අදාළ දේපළ සංචාරක කලාපයක පිහිටා ඇති බැවින් හා ජනතාව මේ පිළිබඳව වැරදි ආකල්පයක් ඇති කරගත හැකි බවත්, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව රඹුක්කන සභාවේ නමට කැලලක් ඇතිවන බැවිනුත් මෙම සංවර්ධන යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව වෙනත් ගැටලුවක් හෝ විරුද්ධත්වයක් හෝ බෙදීමකට යාමට අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලදී.

බෙදීමකට යාමට අවශ්‍යතාවයක් පැන නොගැනී හෙයින් අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත වු බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
නඩු කටයුත්තක් පැවතුන ද සංචාරක කලාපයක පවතින බැවින් හා සභා දේපළ ආරක්ෂා කරගත යුතු බැවින් හැකි ඉක්මනින් යථාතත්වයට පත් කිරීම සඳහා රු.20,578.17 වන ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**vi. 2026.03.04 දින පැවැත් වූ මහසභා රැස්වීමේදී අංක ඊ.01.I.iv යටතේ ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කළ අතර එම කමිටුව 2026.03.09 වන දින පස්වරු 3:00 ස්ථානීය පරීක්ෂාවක් සිදු කරන ලදී. එම කමිටු වාර්තාව අනුමතය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහමම්දු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ ස්ථානීය පරීක්ෂණය සිදුකිරීමට පත්කල කමිටුවෙහි කමිටු වාර්තාව පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කරන ලෙස කමිටු සභාපතිතුමන්ට ආරාධනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

2000 නීත්‍යානුකූල ලියවිලි ලබාගෙන මෙම පාර කැපූ බවත්, වසර ගණනාවකට පසු නඩුවක් ගොනුකර ඇති බවත්, නීතිඥ මහතෙකුට නීති ගාස්තු ගෙවන බවත්, නිලධාරියකු අදාළ නඩුව සඳහා සහභාගි නොවී ඇති බවත්, නීතිඥ මහතා නඩුවට කතා නොකර ඇති බවත්, නමුත් රුපියල් 110,000.00 ක වන්දි මුදලක් ගෙවීමට උසාවියට පෙනී නොසිටීම හේතුවෙන් ඒකමතික තීන්දුවක් ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. යම් දේපළක් අත්පත් කර ගැනීමේ බලය පනතට අනුව සභාව සතු බවත්, නඩුව පැවරූ තැනැත්තිය සමථ වීමට කැමති බව දන්වා ඇති බවත් නමුත් සාකච්ඡා වලට එමට කාන්තාව නොපැමිණි බවත්, තීරණයක් ගැනීමට හදිසි නොවී උසාවි නියෝගය එනතෙක් සිටීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

අදාළ මාර්ගයේ කැපීමේදී අදාළ ඉඩම් හිමියාගේ ඉඩමට පස් තමා තිබූ බවත්, එම පස් ඉවත් කිරීමට දැරූ වියදම උසාවිය විසින් ගෙවීමට නියම කළ බවත්, එය සභාව විසින් ගෙවූ බවත් ප්‍රකාශ කරන ලදී. පැමිණිල්ල විසින් විත්තිය නොමග යැවීමට කටයුතු කරන බවත්, මාර්ගය භාවිතා කරන පුද්ගලයින් විසින් සාධාරණ මුදලක් ගෙවීමට කැමති බවත්, ඒ සඳහා පැමිණිල්ල එකඟතාවය තවම ප්‍රකාශ කර නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම මාර්ගය අත්පත් කර ගැනීමට ඉදිරි වසර කිහිපයක් බලා සිටීම සිදුවන බවත් පැහැදිලි කරන ලදී. එසේම පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා ඇති මුදල ප්‍රායෝගික නොවන බවත් සාධාරණ මුදලකට එකඟ වන්නේ නම් මාර්ගය භාවිතා කරන පුද්ගලයින් විසින් එම මුදල එක්කර ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බවත් ඒ වගේම සභාව නියෝජනය කරන නීතිඥ මහතාව මේ සම්බන්ධව දැනුවත් කර උසාවියට ඉදිරිපත් කළ යුතු බවත්, පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කරන ආකාරයට කටයුතු නොකළ යුතු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා 2026.04.06 වන දින සභාවට පැමිණෙන ලෙස දන්වා තිබූ බවත්, එහිදී පැමිණිලි පාර්ශවය නොපැමිණි බවත් ප්‍රකාශ කරන ලදී .ඒ අනුව එම රැස්වීමේදී ගනු ලැබූ තීරණය සභාවට ඉදිරිපත් කරන ලදී.

- **2026.04.06 දින පැවති සාකච්ඡාවේ තීරණය**

පැමිණි සිටි ඩබ්.විජේකුමාර මහතාගේ මූලිකත්වයෙන් මාර්ගය අවශ්‍ය ප්‍රදේශවාසීන් සභාව විසින් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කිරීමේ මූලික පියවර වශයෙන් අදාළ මාර්ගය මැනීම් කටයුතු සිදු කර ඇති බැවින් එම පිඹුර අනුව පැමිණිලි පාර්ශවයෙන් මාර්ගයට ලබාදිය යුතු නියමිත බිම් ප්‍රමාණය ගණනය කර එහි වටිනාකම පිළිබඳ හා පැමිණිලි පාර්ශවය ඒ සඳහා ගෙවිය හැකි මුදල සම්බන්ධව පැමිණිලි පාර්ශවය සමඟ සාකච්ඡා කර ගනු ලබන තීරණය පිළිබඳ සභාව වෙත 2026.04.25 දිනට පෙර දැනුම් දීමටත්, ගෙවිය යුතු සාධාරණ මුදල මාර්ගය අවශ්‍ය ප්‍රදේශවාසීන් විසින් ගෙවීමට ද එකඟතාවය ප්‍රකාශ කරන ලදී.

මීට අමතරව රුක්මන් මනුශ්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි නැවත මාර්ගය අත්පත් කර ගැනීමකට යාමේදී කාලයක් ගතවන බැවින් මේ තීරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලදී.

බෙදීමක අවශ්‍යතාවය පැන නොනැගුණ බැවින් කමිටු යෝජනාවට අනුව ගත් තීරණය ක්‍රියාත්මක කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
මෙම මාර්ගය අත්පත් කර ගැනීමට යාමේදී නැවතත් විශාල කාලයක් ගතවන බැවින් 2026.04.06 දින පැවති රැස්වීමේ තීරණය අනුව පැමිණිලි පාර්ශවයෙන් මාර්ගයට ලබා දිය යුතු නියමිත බිම් ප්‍රමාණය ගණනය කර එහි තක්සේරු වටිනාකම පැමිණිලි පාර්ශවයට දැන්වීමටත් එම අගය සාධාරණ අගයක් නම් (එනම් ලක්ෂ 02 ට ආසන්න වටිනාකමක් නම් ) හා මාර්ගය භාවිතා කරන පුද්ගලයින් හට ගෙවීමට හැකි මුදල තීරණය කර මීළඟ නඩු දිනය 2026.05.12 පවතින බැවින් 2026.04.25 දිනට පෙර සභාපතිතුමා දැනුවත් කරන ලෙස ඩබ්.විජේකුමාර මහතාට දන්වා යැවීමටත් තීරණය විය.

**vii. කිසියම් දේපළක් මත අක්කර බද්ධක් පැනවීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(3) විධිවිධානයට අනුව උපරිම සීමාව හෙක්ටයාර් 01 ක ප්‍රමාණය ඉක්මවිය යුතුවේ. එහෙත් මෙහි පහත සඳහන් දේපළ ව්‍යවස්ථාපිත නීතියෙන් අනුමත කර ඇති උපරිම සීමාව එම දේපළට අදාළව විස්තර කර ඇති පරිදි ඉක්මවීමක් සිදු කර නොමැති බැවින් එම දේපළ අක්කර බදු ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

| ඉඩමේ නම | වනතේ 134 (3) අදාළ නොවීමට හේතු |
|---|---|
| කහඳවල යෑ වත්ත(දැලිවල වසම) | කැබලි වීම (263 හා 2259 අංක දරණ ඔප්පු පිටපත් හා 2812 හා 2812/01 අංක දරණ පිඹුරු පිටපත්) |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අදාළ යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසූ අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බැවින් ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
දැලිවල වසමේ කහඳවලයෑ වත්ත කැබිලි වීම හේතුවෙන් අක්කර බදු අයකරගත හැකි සීමාව නොඉක්මවන බවට ලේඛන ඉදිරිපත් කර ඇති බැවින් අදාළ දේපළ අක්කර බදු ලේඛනයෙන් කපා හැරීමට තීරණය විය.

**viii. රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු ජාකොබ්වත්ත ඉඩමේහි ඉදිකර ඇති නිල නිවාසය මිනිස් වාසයට සුදුසු තත්වයට පත් කිරීම සඳහා සකස් කරන ලද රු.20,000,00.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අදාළ යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසූ අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බැවින් ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු ජාකොබ්වත්ත ඉඩමේහි ඉදිකර ඇති නිල නිවාසය මිනිස්වාසයට සුදුසු තත්වයට පත් කිරීම සඳහා සකස් කරන ලද රු.20,000,00.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**ix. 2026 වර්ෂයේ අයවැය ලේඛනයට හා සංවර්ධන සැලැස්මට ඇතුළත් කළ යුතු සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

| ඇතුළත් කළ යුතු යෝජනාව | හේතුව |
|---|---|
| **1. කුරුඳුවත්ත කෝංගස් හන්දිය මාර්ගයේ කාණු පද්ධතිය හා මාර්ග කොටස සංවර්ධනය කිරීම රු.1,061,000.00** | **දිට්ඨා හේතුවෙන් ආපදාවට ලක් වීම.** |
| **2. මුව පිටිය වීරතුංග මහතාගේ නිවස අසල කුඹුරට කැඩීගිය මාර්ගය රු.980,000.00** | **2026 වර්ෂයේ සංවර්ධන සැලැස්මෙහි හා අයවැය ලේඛනයේ ඇතුළත් මුවපිටිය කනත්ත අසලින් හලාගිරිය ග්‍රාමය වෙත දිවෙන මාර්ගය වෙනුවට ඇතුලත් කිරීම. ( ග්‍රාමීය මාර්ග යටතේ මෙම මාර්ගය ඉටු කරයි.)** |
| **3. බංගලාවත්ත පළමු පටු මහ සංවර්ධනය කිරීම.රු.780,000.00** | **නව බණ්ඩාරවත්ත මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවට ඇතුළත් කරයි. (මෙම ව්‍යාපෘතියට අධික වියදමක් දැරීමට සිදුවේ. එමෙන්ම යෝජිත ව්‍යාපෘතිය සඳහා මහජන ඉල්ලීම් ඇත.)** |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසූ අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බැවින් ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
2026 වර්ෂයේ අයවැය ලේඛනයට හා සංවර්ධන සැලැස්මට ඇතුලත් කළ සංවර්ධන යෝජනා පහත යෝජනා හා සංශෝධනය කිරීමට තීරණය විය.

| ඇතුළත් කළ යුතු යෝජනාව | ඉවත් කළ යුතු යෝජනාව |
|---|---|
| 1. කුරුඳුවත්ත කෝංගස් හන්දිය මාර්ගයේ කාණු පද්ධතිය හා මාර්ග කොටස සංවර්ධනය කිරීම රු.1,061,000.00 ( දිට්ඨා හේතුවෙන් ආපදාවට ලක් වීම.) | |
| 2. මුව පිටිය වීරතුංග මහතාගේ නිවස අසල කුඹුරට කැඩීගිය මාර්ගය රු.980,000.00 | මුවපිටිය කනත්ත අසලින් හලාගිරිය ග්‍රාමය වෙත දිවෙන මාර්ගය (ග්‍රාමීය මාර්ග යටතේ මෙම මාර්ගය ඉටු කරයි.) |
| 3. බංගලාවත්ත පළමු පටු මහ සංවර්ධනය කිරීම රු.780,000.00 (මෙම ව්‍යාපෘතිය සඳහා මහජන ඉල්ලීම් ඇත.) | නව බණ්ඩාරවත්ත මාර්ගය (මෙම ව්‍යාපෘතියට අධික වියදමක් දැරීමට සිදුවේ.) |

**x. 2026.02.23 දින සිට 2026.03.24 දක්වා ගෙවීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| 2026.02.23 | 236 | මුදල් භාරකරු | 2026 පෙබරවාරි මස ස්ථිර සේවක වැටුප් ගෙවීම | 7,700,614.69 |
| 2026.02.26 | 237 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | ජල බිල්පත් ගෙවීම | 1,258.67 |
| | 238 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | ජල බිල්පත් ගෙවීම | 7,932.33 |
| | 239 | ලේඛා ස්ටේෂනරීස් | රඹුක්කන පුස්තකාල පුවත්පත් බිල්පත් ගෙවීම | 18,200.00 |
| | 240 | ලේඛා ස්ටේෂනරීස් | ඉඹුල්ගස්දෙනිය පුස්තකාල පුවත්පත් බිල්පත් ගෙවීම | 15,760.00 |
| 2026.02.27 | 241 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් ගෙවීම | 30,000.00 |
| | 242 | මුදල් භාරකරු | ගමන් වියදම් ගෙවීම | 4,074.00 |
| 2025.03.03 | 243 | sky Elevator Tech (pvt) Ltd | නව ශ්‍රවණාගාර සංකිර්ණයේ විදුලි සෝපාන සැපයිම,සවිකිරිම ,ක්‍රියාකාරිත්වය පරික්ෂා කිරිම කර්මාන්තයේ අත්තිකාරම් මුදල් ගෙවීම | 1,306,260.00 |
| | 244 | එම්.පී. එල්.කේ. ධර්මශ්‍රී | රඹුක්කන පොදු වැසිකිලිය - ඇපතැන්පත් මුදල් ආපසු ගෙවීම | 31,288.74 |
| | 245 | the associated news paper of Ceylon Limited | සභා දේපල වල වෙළඳ අයිතිය 2026 වර්ෂයට ටෙන්ඩර් කීරිමේ ප්‍රසම්පාදන දැන්වීම් පල කිරිමේ ගාස්තු ගෙවීම | 19,116.00 |
| | 246 | Derector Jeneral of Pension | පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක බිල්පත් ගෙවීම | 30,050.37 |
| | 247 | මුදල් භාරකරු | එච්.ආර්.අයි.පී.එස්.කේ. මැණිකේ මියගෙන් විශේෂ අත්තිකාරම් වැඩිපුර අයවීම් ගෙවීම | 400.00 |
| | 248 | බීජ්.අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 8,422.00 |
| | 249 | එම්.ජී.ජී.කේ.මැදවත්ත | අතිකාල දීමනා ගෙවීම | 11,985.00 |
| | 250 | එල්.ආර්.ජී.ඩී. කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 5,000.00 |
| | 251 | ගබ්බල උතුර කෘෂි නිෂ්පාදන ගොවි සංවිධානය | ගබ්බල උතුර වල්පොල මාර්ගය සංවර්ධනය කිරිම | 313,057.36 |
| | 252 | සි/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඊදැල්ල වත්ත හරන්කහ තැන්න හරහා වල්ගම මාර්ගය සංවර්ධනය කිරිම -10% රැඳවුම් මුදල් ගෙවීම | 30,973.68 |
| 2026.03.04 | 253 | මුදල් භාරකරු | 2026 පෙබරවාරි මස සභික දීමනා ගෙවීම | 26,500.00 |
| | 254 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරිම | 60,000.00 |
| | 255 | මුදල් භාරකරු | වාහන ආදායම් බලපත්‍ර ලබා ගැනිමට අත්තිකාරම් මුදල් ලබා ගැනිම | 27,270.00 |
| 2026.03.05 | 256 | Kegqll Distributors(pvt)Ltd | අආදාහනාගාරය සඳහා ලිට්රෝ ගෑස් 37.5 Kg සිලින්ඩර 06 මිළදි ගැනිම | 99,395.00 |
| | 257 | ඩී.ආර්.මංගලිකා | හිඟ වැටුප් ගෙවීම | 25,658.76 |
| | 258 | රජයේ මුද්‍රණාලාධිපති | මාර්ග සිතියම් ගැසට් පත්‍රයේ පල කීරිම සඳහා ගාස්තු ගෙවීම | 12,768.78 |
| | 259 | කේ.ඩබ්.නිසංසලා මැණිකේ | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 35,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 260 | ටී.ජී. ඩබ්.කේ. මැණිකේ | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 261 | එම්.ජී.ආර්.ආර්. දමයන්ති | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 262 | කේ.එම්.එම්.බංඩාර | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 263 | පි.ඊ.බී.තෙලිජ්ජගොඩ | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| | 264 | එල් ආර්. ජයසුන්දර බණ්ඩා | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 265 | කේ.එම්.කේ.පි. රත්නායක | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 266 | මුදල් භාරකරු | සැලසුම් කමිටු දීමනා ගෙවීම | 15,500.00 |
| | 267 | පි.ඩි.ඩබ්. චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 5,000.00 |
| | 268 | තිළිණි නිරෝෂණි | ගමන් වියදම් ගෙවීම | 5,000.00 |
| | 269 | ඩබ්.ජී.එල්. සුබසිංහ | අතිකාල දීමනා ගෙවීම | 2,996.29 |
| 2026.03.06 | 270 | ජ්‍යේෂ්ඨ පුරවැසි සංවිධානය | හේනේපොල ඊරියගහදෙනිය මාර්ගය බෝක්කු බට යොදා සංවර්ධනය කිරීම | 8,400.57 |
| 2026.03.09 | 271 | උඩුගම එක්සත් වීර ග්‍රාම සංවර්ධන සමිතිය | හත්බෑව වතුයායේ කෙම්පිටිය කොටස සනිපාරක්ෂක පහසුකම් සැලසීම | 94,721.97 |
| | 272 | Metropolitan Technologies (pvt) ltd | Cannon Toner 10 සැපයිම වෙනුවෙන් ගෙවීම | 212,400.00 |
| | 273 | භාෂිත ගැෆික් | බැනරයක් සකස් කිරීම වෙනුවෙන් ගෙවීම | 528.00 |
| | 274 | භාෂිත ගැෆික් | මහ සභා වාර්තා ඇමුණුම් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම | 1,903.00 |
| | 275 | භාෂිත ගැෆික් | මහ සභා වාර්තා මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම | 4,530.00 |
| | 276 | භාෂිත ගැෆික් | මුද්‍රා 02 සැපයිම වෙනුවෙන් ගෙවීම | 4,100.00 |
| | 277 | පී.ජී.එල්.සී. කුමාර | RD - 5925 ට්‍රැක්ටරය අලුත් වැඩියාවක් සිදු කිරීම | 600.00 |
| | 278 | වන් වේ ටයර් සෙන්ටර් ඇන්ඩ් වීල් ඒලයිමන්ට් | RD - 8009 ට්‍රැක්ටරය අලුත් වැඩියාවක් සිදු කිරීම | 400.00 |
| 2026.03.10 | 279 | මුදල් භාරකරු | 2026 පෙබරවාරි මස අපද්‍රව්‍ය කළමණාකරණ සේවකවැටුප් ගෙවීම | 117,300.00 |
| | 280 | මුදල් භාරකරු | 2026 පෙබරවාරි මස සභික දීමනාව ගෙවීම | 45,000.00 |
| | 281 | මුදල් භාරකරු | පරිසර බලපත්‍ර අධීක්ෂණ කටයුතු දීමනා ගෙවීම | 750.00 |
| | 282 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් ගෙවීම | 15,000.00 |
| | 283 | මුදල් භාරකරු | සභික දීමනා ගෙවීම | 15,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 284 | ආර්.ජී.එස්.නිරේෂන් | රජයේ නිවාඩු දින සේවය කිරිම වෙනුවෙන් වැටුප් ගෙවිම | 17,141.00 |
| | 285 | එස්.ඒ.එන්.කේ.සේනාරත්න | ගමන් වියදම් ගෙවීම | 339.50 |
| | 286 | බී.ඒ.අසංක කුමාර | ගමන් වියදම් ගෙවීම | 3,500.00 |
| | 287 | ඩබ්.ඩබ්. ඩී. වීරක්කොඩි | ගමන් වියදම් ගෙවීම | 2,100.00 |
| | 288 | එස්.ජේ.එස්. සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 4,400.00 |
| | 289 | කේ.ඒ.එස්.එන්.බණ්ඩාර | අතකාල දීමනා ගෙවීම | 5,443.00 |
| | 290 | එස්.ජේ.එස්. සමරසිංහ | අතකාල දීමනා ගෙවීම | 21,543.33 |
| | 291 | ඩබ්.ඒ.අයි.එම්.විජේකෝන් | අතකාල දීමනා ගෙවීම | 8,618.00 |
| | 292 | කේ.පී. එස්.සි. අබේරත්න | අතකාල දීමනා ගෙවීම | 5,385.00 |
| | 293 | එස්.ඩබ්.එස්.ශ්‍රියානන්ද | අතකාල දීමනා ගෙවීම | 4,148.14 |
| | 294 | ඩී.ඩබ්.ජී.ඒ. සඳරුවන් | අතකාල දීමනා ගෙවීම | 3,555.55 |
| | 295 | එච්.ඩබ්.ඒ.අයි.එල් වීරකෝන් | අතකාල දීමනා ගෙවීම | 2,953.88 |
| | 296 | එස්.එන්.නන්දශ්‍රී | අතකාල දීමනා ගෙවීම | 7,574.07 |
| | 297 | එස්.ඩබ්.සී.එස්.නන්දන | අතකාල දීමනා ගෙවීම | 4,560.87 |
| | 298 | ජී.ජී.බී.ඒ.කුමාර් | අතකාල දීමනා ගෙවීම | 4,349.20 |
| | 299 | ජී.ඒ.බන්දුසේන | අතකාල දීමනා ගෙවීම | 8,314.81 |
| | 300 | පී.ගීත් ප්‍රේමශ්‍රී | අතකාල දීමනා ගෙවීම | 5,438.89 |
| | 301 | එස්.ඩබ්.පී. ධර්මසේන | අතකාල දීමනා ගෙවීම | 1,997.68 |
| | 302 | ඩබ්.ඩබ්. ඩී. වීරක්කොඩි | අතකාල දීමනා ගෙවීම | 13,946.82 |
| | 303 | එච්.ඒ.සී.එල් පියසේන | අතකාල දීමනා ගෙවීම | 6,439.46 |
| | 304 | ඩබ්.ඩී.එස්.කේ පියතිලක | අතකාල දීමනා ගෙවීම | 4,571.25 |
| | 305 | එච්.සී.කේ. හෙට්ටිගොඩ | අතකාල දීමනා ගෙවීම | 11,563.08 |
| | 306 | එම්.එන්. පද්මසිරි | අතකාල දීමනා ගෙවීම | 7,490.74 |
| | 307 | එන්.ජී. ඒ.ප්‍රියන්ත කුමාර | අතකාල දීමනා ගෙවීම | 7,041.29 |
| | 308 | ඩබ්.නලින් පුෂ්ප කුමාර | අතකාල දීමනා ගෙවීම | 3,601.92 |
| 2026.03.11 | 309 | සනිම්ඩ්වත්ත එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය | සනිමේට්වත්ත 2 වන පටුමග කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරිම සඳහා ගෙවිම | 400,827.52 |
| | 310 | දිසාවන නිලධාරි - කෑගල්ල | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ඉඩම සඳහා වාර්ෂික අවසර පත්‍ර ගාස්තු ගෙවිම | 13,824.00 |
| | 311 | රෙජිස්ට්‍රාර් ජනරාල් | මුද්දර උපලේඛන සේවා ගාස්තු ගෙවිම | 17,600.00 |
| | 312 | පළාත් පාලන කොමසාරිස් | උසාවි දඩ 1% දිරි දීමනා ගෙවීම | 1,145.00 |
| | 313 | ආදායම් ගණකාධිකාරි, ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවිම | 36,419.31 |
| | 314 | ආදායම් ගණකාධිකාරි, ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවිම | 9,274.33 |
| | 315 | ආදායම් ගණකාධිකාරි, ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවිම | 1,193.84 |
| | 316 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | ජල බිල්පත් ගෙවිම | 73,128.88 |

| | | | | |
|---|---|---|---|---|
| | 317 | ගුණවර්ධන සෙරමික් | බතඹුරය ක්‍රීඩාංගනය වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරිමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 3,070.00 |
| | 318 | නාලක එක්සසයිස් බුක් ඉන්ඩ්‍රස්ට්‍රීස් | සුදු A4 පැකට් 200 සැපයිම වෙනුවෙන් ගෙවීම | 172,975.00 |
| | 319 | රංජනි බේක් හවුස් | මහ සභාව සංග්‍රහ වියදම් ගෙවීම | 3,910.00 |
| | 320 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2025 දෙසැම්බර් මසට අදාළ දුම්රිය බලපත්‍ර සඳහා ගෙවීම | 3,500.00 |
| | 321 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජීස් ප්‍රයිවට් ලිමිටඩ් | කාර්යාලයේ canon වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර 11 ක් සහ samsung මුද්‍රණ යන්ත්‍ර 02 වසරක කාලයක් සඳහා සේවා නඩත්තු කටයුතු වෙනුවෙන් ගිවිසුම් ගත විමට අදාළ ගාස්තු ගෙවීම | 154,580.00 |
| | 322 | ආර්.ඒ.පී.එස්. කුමාර | ගලි සේවාව සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 9,875.00 |
| | 323 | පී.ඒ.එන්.එස්.කේ.ගලගොඩ | ගලි සේවාව සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 9,875.00 |
| | 324 | ඒ.එස්.එම් ජාබිර්. | ගලි සේවාව සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 9,875.00 |
| | 325 | ඒ.ආර්.එම්.සැකි | ගලි සේවාව සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 9,875.00 |
| 2026.03.12 | 326 | ඩබ්.ඩී.එස්.කේ.පියතිලක | ගමන් වියදම් ගෙවීම | 2,100.00 |
| | 327 | ආර්.එම්.එස්.ඒ රත්නායක | ගමන් වියදම් ගෙවීම | 5,368.00 |
| | 328 | මුදල් භාරකරු | 2026 පෙබරවාරි මස සභික දීමනාව ගෙවීම | 15,000.00 |
| | 329 | මුදල් භාරකරු | ගලිරථ දිරි දිමනා ගෙවීම | 17,500.00 |
| 2026.03.13 | 330 | c-com Equipment (pvt)Ltd | SGZA -0108 බොබ් කැට් යන්ත්‍රය අලුත් වැඩියා කිරිම | 120,550.06 |
| | 331 | වයි.එච් ඩී.සිල්වා | පුස්තකාලය සඳහා පොත් මිළදී ගැනිම | 5,390.00 |
| | 332 | ඩී.එම්.ඩී. බී.දිසානායක | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 66,415.87 |
| | 333 | ආර්.එම්.එම්.එස්.කේ.රත්නායක | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 334 | සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය | සේනානායක මාවත - වානේ රාමුවක් සවි කීරිම | 6,561.00 |
| | 335 | ඩී.එල් ප්‍රසාද් විමලරත්න | නීතිඥ නඩු ගාස්තු ගෙවීම | 38,000.00 |
| | 336 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරිම | 60,000.00 |
| | 337 | එච්.ඒ.ආර්.එම්.කේ හෙට්ටිආරච්චි | අනවසර ඉදිකිරිම් වර්ණ ජායා රූප ගැනිමට අතින් වියදම් කල මුදල් ගෙවීම | 540.00 |
| | 338 | එන්.ජී. ඒ.ප්‍රියන්ත කුමාර | ආදාහනාගාර රේක්ක දෙක අලුත් වැඩියා කිරීම සඳහා අතින් වියදම් කල මුදල් ගෙවීම | 2,000.00 |
| | 339 | ජී.ආර්.වයි.සමන් කුමාරි | අතිකාල දිමනා ගෙවීම | 1,872.68 |
| | 340 | ඩී.ආර්.ඒ.පේමසිරි | අතිකාල දිමනා ගෙවීම | 7,015.37 |
| | 341 | ඊ.එම්.එන්.ඒකනායක | අතිකාල දිමනා ගෙවීම | 8,565.00 |
| | 342 | පි.ජී. සුධර්මා කුමාරි | අතිකාල දිමනා ගෙවීම | 2,380.29 |

| | | | | |
|---|---|---|---|---|
| | 343 | මදල් භාරකරු | 2026 පෙබරවාරි මස සභික දීමනා ගෙවීම | 15,000.00 |
| 2026.03.16 | 344 | ජේ.එම්.ඩී. විරතුංග | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 345 | එච්.ආර්.ඩබ්.පි. සම්පත් කුමාරි | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 346 | ඒ.ඩබ්.ජයරත්න | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 347 | එච්.ඒ.ආර්.එම්.කේ. හෙට්ටිආරච්චි | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 348 | ආර්.ජේ.ඩබ්.එම්.ආර්.එල්.කේ.රාජකරුණා | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 349 | ආර්.ඒ.ඩී. ප්‍රේමරත්න | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 350 | එල්.කේ.එස්.ගුණතිලක | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 351 | යූ.ඒ.වී.එස්. බෝගහවත්ත | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 352 | ජී.ආර්.වයි.සමන් කුමාරි | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 353 | එච්.ඒ.එස්.ආර්.හේනක ආරච්චි | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 354 | කේ.ජී. එස්.සි. අබේරත්න | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 355 | ඒ.ජී.ඒ.එස්.ප්‍රැන්සිස් | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 356 | පී.ඩී.සි. ජයරත්න | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 357 | ඒ.ඩී.එස්.එන්.ගුණරත්න | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 358 | එන්.එම්.ටී.එන්. සෙනවිරත්න | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 359 | ඒ.ජී.ආර්.එස්.ආර්.ගමගේ | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 360 | ටි. ආර්.එන්.තාඹුගල | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 361 | වයි.එම්.අයි.කේ.වයි.බණ්ඩාර | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 362 | එන්.පි.එන්.අනුරාධා | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 363 | බි.එන්.එන්. එස්. ජයකොඩි | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 364 | කේ.ඒ.එස්.නිෂාදි බණ්ඩාර | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 365 | ආර්.පී.එස්.ජයතිස්ස | භාණ්ඩ සමීක්ෂණ දීමනා ගෙවීම | 4,000.00 |
| 2026.03.17 | 366 | ඒ.ඒ.පී. අධිකාරි | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| | 367 | එච්.ඒ.ආර්.එම්.කේ. හෙට්ටිආරච්චි | ගමන් වියදම් ගෙවීම | 3,008.00 |
| | 368 | ඩබ්.ඒ.එන්.කේ.වර්ණසූරිය | ගමන් වියදම් ගෙවීම | 1,385.16 |
| | 369 | ඩබ්.ඒ.එන්.කේ.වර්ණසූරිය | ගමන් වියදම් ගෙවීම | 1,428.00 |
| | 370 | ශ්‍රී ලංකා ටෙලිකොම් පි.එල්.සී. | දුරකථන බිල්පත් ගෙවීම | 3,095.99 |
| | 371 | ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවීම | 70,212.24 |
| | 372 | රංජනී බේක් හවුස් | මහ සභාව සංග්‍රහ වියදම් ගෙවීම | 2,630.00 |
| 2026.03.19 | 373 | යූ.ජී අබේරත්න බණ්ඩා | දැව ප්‍රවාහන ඇප මුදල් ආපසු ගෙවීම | 20,000.00 |
| | 374 | නිරෝගා වැඩිහිටි සමිතිය | මොට්ටප්පුලිය වත්ත මාර්ගය පැති බැම්ම ඉදි කිරීම -10% රැඳවුම් මුදල් ගෙවීම | 100,442.43 |
| | 375 | සිහින ආකිටෙක් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් | කොම්පෝස්ට් අංගනයේ ආරක්ෂිත වැට සහ ගේට්ටුව අලුත්වැඩියා කිරීම ව්‍යාපෘතියේ පළමු කොටස බිල්පත් ගාස්තු ගෙවීම | 374,278.43 |
| | 376 | අඹුවන්ගල ග්‍රාම සංවර්ධන සමිතිය | කෝන්ගස්හන්දිය කුරුදුවත්ත මාර්ගය සංවර්ධනය කිරිම | 1,625,510.23 |

| | | | | |
|---|---|---|---|---|
| | 377 | කේ.පී.ඒ.එන්. ජයකොඩි | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 5,000.00 |
| 2026..03.20 | 378 | තරිඳු මෝටර්ස් | ZA0108 බොබ් කැට් යන්ත්‍රය අලුත් වැඩියා කිරීම | 28,475.00 |
| 2026.0323 | 379 | ආර්.ආර්. කන්ස්ට්‍රක්ෂන් | ආදාහනාගාරය අලුත් වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 152,490.00 |
| | 380 | ශ්‍රී ලංකා ඉන්ෂුවරනස් කෝපරේෂන් | කොම්පෝස්ට් අංගනය ගොඩනැඟිලි පරිශ්‍රය හිඟ තක්සේරු මුදල ගෙවීම | 2,584.14 |
| | 381 | නිව් ජෙන් කම්පියුටර් | පරිගණක යන්ත්‍ර 07 අලුත් වැඩියා කිරීම සහ සේවා කිරීම වෙනුවෙන් ගෙවීම | 21,100.00 |
| | 382 | එච්.පි.නලින් නන්දසේන | තණකොළ කපන යන්ත්‍ර 06 අලුත් වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 32,975.00 |
| | 383 | ශ්‍රී ලංකා ටෙලිකොම් පි.එල්.සී. | දුරකථන බිල්පත් ගෙවීම | 12,673.56 |
| | 384 | සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය | ඉන්ධන බිල්පත් ගෙවීම | 618,516.40 |
| | 385 | මුදල් භාරකරු | 2026 මාර්තු මස ස්ථිර සේවක වැටුප් ගෙවීම | 7,884,826.01 |
| 2026.03.24 | 386 | වළල්ගොඩ ගොවි සංවිධානය | වළලල්ගොඩ මල්මිය පේළි නිවාස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 1,502,893.17 |
| | 387 | කෙම්පිටිය ගොවි සංවිධානය | හත්බෑව වතුයායේ කෙම්පිටිය කොටස සනිපාරක්ෂක පහසුකම් සැලසීම අවසන් බිල්පත් ගාස්තු ගෙවීම | 724,503.54 |
| | 388 | ජේ.එම්.ඩී. විරතුංග | අතිකාල දීමනා ගෙවීම | 13,659.00 |
| | 389 | ඒ.ඩබ්.ජයරත්න | අතිකාල දීමනා ගෙවීම | 11,595.29 |
| | 390 | එච්.ඒ.ආර්.එම්.කේ. හෙට්ටිආරච්චි | අතිකාල දීමනා ගෙවීම | 3,042.00 |
| | 391 | ආර්.ජේ.ඩබ්.එම්.ආර්.එල්.කේ.රාජකරුණා | අතිකාල දීමනා ගෙවීම | 2,974.70 |
| | 392 | ආර්.ඒ.ඩී. ප්‍රේමරත්න | අතිකාල දීමනා ගෙවීම | 6,466.28 |
| | 393 | යූ.ඒ.වී.එස්. බෝගහවත්ත | අතිකාල දීමනා ගෙවීම | 1,723.67 |
| | 394 | ආර්.පි.එස්.ජයතිස්ස | අතිකාල දීමනා ගෙවීම | 8,146.00 |
| | 395 | එච්.ඒ.එස්.ආර්.හේනක ආරච්චි | අතිකාල දීමනා ගෙවීම | 4,702.55 |
| | 396 | කේ.ජී. එස්.සි. අබේරත්ත | අතිකාල දීමනා ගෙවීම | 11,848.00 |
| | 397 | ඒ.ජී.ඒ.එස්.ප්‍රැන්සිස් | අතිකාල දීමනා ගෙවීම | 3,070.00 |
| | 398 | පී.ඩී.සි. අබේරත්න | අතිකාල දීමනා ගෙවීම | 3,633.45 |
| | 399 | ඒ.ඩී.එස්.එන්.ගුණසේකර | අතිකාල දීමනා ගෙවීම | 2,423.62 |
| | 400 | එන්.එම්.ටී.එන්. සෙනවිරත්න | අතිකාල දීමනා ගෙවීම | 4,992.00 |
| | 401 | ඒ.ජී.ආර්.එස්.ආර්.ගමගේ | අතිකාල දීමනා ගෙවීම | 10,637.00 |
| | 402 | ටි. ආර්.එන්.තාඹුගල | අතිකාල දීමනා ගෙවීම | 8,280.71 |
| | 403 | වයි.එම්.අයි.කේ.යාපා බණ්ඩාර | අතිකාල දීමනා ගෙවීම | 5,770.98 |
| | 404 | එන්.පි.එන්.අනුරාධා | අතිකාල දීමනා ගෙවීම | 1,321.65 |
| | 405 | කේ.ඒ.එස්.නිෂාදි බණ්ඩාර | අතිකාල දීමනා ගෙවීම | 7,179.00 |
| | 406 | ඩී.ජී.සි.ඩී එස්.කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 10,233.08 |
| | 407 | ඒ.ජී.ඒ.එස්.ප්‍රැන්සිස් | ගමන් වියදම් ගෙවීම | 679.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 408 | ආර්.ඒ.ඩී. ප්‍රේමරත්න | ගමන් වියදම් ගෙවීම | 679.00 |
| | 409 | ඒ.ජී.ආර්.එස්.ආර්.ගමගේ | ගමන් වියදම් ගෙවීම | 1,164.00 |
| | 410 | ඩී.එම්.ටී. නිරෝෂණී | ගමන් වියදම් ගෙවීම | 4,200.00 |
| | 411 | පී.ඩී. ඩබ්.චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 3,850.00 |
| | 412 | එල්.ආර්.ඒ.ඩී. කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 5,000.00 |
| | 413 | ඒ.ඩී.එස්.එන් .ගුණසේකර | ගමන් වියදම් ගෙවීම | 388.00 |
| | 414 | මුදල් භාරකරු | සභික දීමනා ගෙවීම | 45,000.00 |
| | 415 | මුදල් භාරකරු | සැලසුම් කමිටු දීමනා ගෙවීම | 18,000.00 |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාවයක් නොමැති බැවින් මහසභා අනුමැතිය ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

2026.02.23 දින සිට 2026.03.24 දක්වා ගෙවීම් වාර්තාව අනුමත තීරණමට තීරණය විය.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අද දින මහසභාව වෙත ප්‍රනීත තේ පැන් සංග්‍රහයක් ලබාදීම සම්බන්ධව සුක්රි මන්ත්‍රීතුමන්ට විශේෂ ස්තුතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදී.

**(ඊ).02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය**

**i. මා මෙම රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවට සම්බන්ධ වී සිටින අතර මා හට සිකුරාදා දින වෛද්‍ය සහනයකට සම්බන්ධ වන බැවින් සහ කමිටුව පවත්වන වෙලාවට ප්‍රවාහන පහසුකම් අඩු බැවින් පරිසර හා පහසුකම් කාරක සභාවට සම්බන්ධ කර දෙන ලෙස සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය**

සිකුරාදා දිනයේ වෛද්‍ය සායනයකට යොමුව සිටින බැවින් එය උදේ 8.00 හෝ සවස 2.00 ට පවතින බැවිනුත් හා කිරිවත්දෙණිය මාර්ගයේ බස් ගමනාගමනය නිශ්චිත කාලයක පමණක් පවතින බැවිනුත් සිකුරාදා දිනයෙහි එම වේලාවට පැමිණීමේ අපහසුතාවක් පවතින බැවින් හා කුලිරියකින් පැමිණියහොත් ඒ සඳහා රු.800.00 ක් වැනි මුදලක් ගෙවීමට සිදුවන බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

පරිසර හා පහසුකම් කාරක සභාවේ මේ වන විටත් සිටින සාමාජිකයින් සංඛ්‍යාව ප්‍රමාණවත් බවත්,වෛද්‍ය හේතූන් මත මෙතුමිය මෙම යෝජනාව ඉදිරිපත් කරන බැවිනුත් මෙතුමියට වෙනත් කමිටුවකට දැමීම ඵල රහිත බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය**

ගරු උපසභාපතිතුමනි, තමාට මසකට දින 04 ක් කමිටු සඳහා පැමිණිය නොහැකි බැවින් වෙනත් කමිටුවකට යොමු කරන ලෙස ඉල්ලා සිටින බවත්, ඒ වගේම වෛද්‍ය සායනයට සම්බන්ධ ලියකියවිලි තමා ළඟ පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

කමිටු පත් කිරීමේ බලය පවතින්නේ සභාපතිතුමන් සතුව බැවින් මෙතුමියගේ වෛද්‍ය හේතුන් මත වෙනත් කමිටුවකට දැමීම ඉතා සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නීතිය අනුව කාරක සභා කමිටු පත්කිරීමේ බලය තමා සතු නමුත් මෙම යෝජනාවට ප්‍රතිශෝධනයක් සිදු කළ යුතුතේ මාස 06 ට වත් පසුව බවත්, මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව ඉතා වැදගත් කමිටුවක් බවත්, කාර්යාලයේ කටයුතු රඳාපවතින්නේ මෙම කමිටුව රැස්වන කාලය මත බවත් ප්‍රකාශ කරන ලදී. මහජනතාවගේ නියෝජිතයෙකු ලෙස පත්ව සිටින ඔබ සැමට ඉතා ගෞරවයක් මෙම කමිටු නියෝජනය කිරීමට ලැබීම බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ඇත්තෙන්ම මෙතුමියට සාධාරණයක් කළයුතු බැවින් ඇයගේ සායනික වේලාව අනුව කමිටු වේලාව තීරණය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. බෙදීමක අවශ්‍යතාවයක් නොමැති බැවින් මහසභා අනුමැතිය ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.ආර්.ප්‍රදිපා රංජනී මැතිතුමිය**

සායන පවතින වෙලාව පැහැදිලිව කිව නොහැකි බව ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මසකට 12 වතාවකටත් වඩා තමා සභාවේ විවිධ අවස්ථාවලට සහභාගී වන බවත්, මුදල් කමිටුව සිකුරාදා ප.ව.2.00 ට පවතින බැවින් සභාවේ දේපළ ටෙන්ඩර් කිරීමේදී අදාළ දින වකවානු පවතින බැවින් එය ඒ විදිහටම සිදු කිරීමටත් සහා කර්මාන්ත හා මිලදී ගැනීමේ ටෙන්ඩර් සිකුරාදා දින ප.ව.1.00 ට පමණ විවෘත කිරීමට යොදා ගැනීමට හැකි නම් ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එක් කමිටුවක් නොව කමිටු හතරට සංශෝධනය කිරීම සුදුසු බවත්, තමාගේ රුචිකත්වය ලබන සභා වාරයට ඉදිරිපත් කරන ලෙසත්, ඉන් අනතුරුව ජූනි මස සභාවාරයේදී කමිටු සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කළ හැකි බව ප්‍රකාශ කරන ලදී. අදාළ යෝජනාව සම්බන්ධව විරුද්ධත්වයක් පැන නැගීය බැවින් හා එය ක්‍රියාත්මක කිරීම ගැටළු සහගත වන බැවින් තම රුචිකත්වය ලබන සභාවාරයට ඉදිරිපත් කරන ලෙස දන්වමින් මෙම යෝජනාව ප්‍රතික්ෂේප වූ බව සඳහන් කරන ලදී.

තීරණය -

තම රුචිකත්වය ලබන (මැයි) සභාවාරයට ඉදිරිපත් කරන ලෙසටත්, ඒ අනුව ඊළඟ (ජූනි) සභාවාරයේදී අදාළ කමිටු පත්කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමටත් තීරණය විය.

**(ඊ).03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

i. **ගරු මන්ත්‍රීතුමන්ලාට/තුමියන්ලාට ලබා දෙන ගමන් වියදම් කීලෝමීටරයක් සඳහා රු 10.00 ක ප්‍රමාණයක් ගෙවන බැවින් එය රු.100.00 දක්වා වැඩි කිරීමට සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාව කැඳවූ දා සිට මේ වන තෙක් කිසිදු මන්ත්‍රීවරයකුට /මන්ත්‍රීතුමියකුට ගමන් වියදම් දීමනාව ප්‍රමාණවත් නොවන බැවින් ලබා නොගත් බවත්, නමුත් ඉන්ධන මිල ඉහළ යාමත් සමඟ ගමන් වියදම් දීමනාව ලබා ගැනීමේ අවශ්‍යතාවය පැන නගින බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

අද වනවිට මුළු ලෝකයම මෙම ආර්ථික අපහසුතාවයකට පත්ව සිටින බවත්, මෙසේ ප්‍රතිලාභ වැඩි කර ගැනීමට උත්සාහ කිරීම මේ පවතින ව්‍යසනයත් සමඟ සාධාරණීකරණය කිරීමට යමෙකුට හැකි වුවද මහජන සුභසාධනය උදෙසා දේශපාලනයට පැමිණ සිටින අප එවැනි තීරණයකට යාම කාලෝචිත නොවන බවත්, මෙම පීඩනය දරා ගැනීමේ හැකියාව මහජන නියෝජිතයින් හැටියට අපට කළ හැකි බව මහජනතාවට ඔප්පු කිරීමට මෙය කදිම අවස්ථාවක් බැවින් දීමනා වැඩි කරගත යුතු නමුත් ඒ සඳහා මෙම මොහොත උචිත නොවන බැවින් කණ්ඩායමක් වශයෙන් මෙම යෝජනාවට විරුද්ධත්වය ප්‍රකාශ කරන බව ප්‍රකාශ කරන ලදී

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

සමස්ථ මන්ත්‍රී මණ්ඩලයටම අදාළ යෝජනාවක් බවත් ආදර්ශයක් දෙන විට එය ලබාදිය යුත්තේ පොඩි තැනින් නොව රටක පවතින ඉහළම ස්ථානයෙන් බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

රුක්මන් මන්ත්‍රීතුමාගේ යෝජනාව හොඳයි. නමුත් රටක් වශයෙන් රජය පත්ව තිබෙන ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට එකඟ විය නොහැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

අවශ්‍ය අවස්ථාවේදී නැතිම වෙන අවස්ථාවක ලැබීම අවශ්‍ය නොවන බවත්,මහජන නියෝජිතයකු ලෙස කරන සේවාවටද මෙම රු.10.00 දීමනාව විහිළු සහගත බවත්, නවක මන්ත්‍රීවරුන් ලෙස අත්දැකීම් නොමැති කම මත මෙවැනි දේ සඳහා විරෝධය දැක්වුවද දේශපාලනයෙන් පරිණත වන විට එකඟතාවය ප්‍රකාශ කළද එවිට ප්‍රමාද වැඩි බවත්, බහුතර බලයක් පවතින බැවින් මෙම යෝජනාවට විරුද්ධත්වය ප්‍රකාශ කර පරාජයට පත් කිරීමේ හැකියාව පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඉතා වැදගත් යෝජනාවක් බවත්, 1990 සිට ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ සිටි බවත්, එකල පක්ෂ විපක්ෂ භේදයකින් තොරව වැදගත් යෝජනාවලට සහයෝගය ලබා දුන් බවත්, නමුත් වර්තමානයේ පවතින ආණ්ඩුව විපක්ෂය විසින් ඉදිරිපත් කරන යෝජනා හොඳ හෝ නරක වේවා විරුද්ධ වන බවත්,කම්කරුවන්ට දක්වන සැලකිල්ල මහජන නියෝජිතයින් හට නොදක්වන ලෙසත්, සභික දීමනාව මුලින්ම රු1,095 ක් ද එය රු.2,095 ක් වූ අතර ක්‍රමක්‍රමයෙන් රු.23,000.00 වැඩි කරගත්තද නැවත එය රු.15,000.00 අඩු කර ඇති බවත්, දරුවන්ගේ ප්‍රශ්න දෙමව්පියන්ට පවසනවා නම් මහජන නියෝජිතයින්ගේ ප්‍රශ්න සභාපතිතුමන්ට ඉදිරිපත් කිරීමේ වරද කුමක් දැයි ප්‍රශ්න කරන ලදී.

ඒ වගේම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සම්බන්ධව එකල චක්‍ර ලේඛන නිකුත් කළේ පළාත් පාලන ලේකම් බවත්, වර්තමානයේ පළාත් පාලන ඇමැති චක්‍රලේඛ නිකුත් කරන බවත්, නමුත් පළාත් සභාවක් නොමැති බැවින් ඇමති කෙනෙකු නොමැති අතර එබැවින් ජනාධිපති පත්කළ නිලධාරියකු විසින් චක්‍රලේඛන නිකුත් කරන බවත් එතුමාට මේ සම්බන්ධව කරුණු වාර්තා කිරීම උචිත බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

ලෝක අර්බුදයත් සමඟ රටේ පවතින වාතාවරණයත් සමඟ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට මෙය සුදුසු කාලයක් නොවන බව ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරන බවත්, නමුත් විපක්ෂ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරන්නේ මෙම රු.100.00 වැඩි කිරීම කාලෝචිත බවත්, රඹුක්කන ප්‍රාදේශීය සභාව රටටම හොඳ ආදර්ශයක් ලබාදෙමින් මෙම රු.10.00 දීමනාව ලබා නොගන්නා බවට ආණ්ඩුකාරතුමිය වෙත දන්නා යැවීමට ස්වාධීන මන්ත්‍රීවරයකු වන තමා යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙම යෝජනාවට විරුද්ධත්වය ප්‍රකාශ කළේ රටේ පවතින ආර්ථික තත්ත්වය හමුවේ බවත්, මෙම දීමනා මුදල පමණක් නොව කම්කරු ජනතාවගේ දෛනික දීමනාවේ සිට සෑම දීමනාවක්ම පාහේ වෙනස් විය යුතු බවත්, මෙම රු.100.00 දීමනාව ලබාගත හැකි වන්නේ රු.8,000.00 දීමනාවෙන්ම බවත් ප්‍රකාශ කරන ලදී.

තවද, V 8 වාහන සම්බන්ධව විපක්ෂ මන්ත්‍රීවරුන් විසින් ප්‍රකාශ කළ බවත්,නමුත් පවතින ආණ්ඩුව විසින් එම වාහන නොගෙන් වූ බවත්, අමාත්‍යාංශයක වැඩ කිරීමේදී එහි පවතින්නේ V 8 වාහනයක් නම් එය භාවිතා කිරීමට සිදුවන බවත්, ගැළපෙන වාහන මිලදී ගැනීමට ඉදිරිපත් කර ඇති බවත්, ඵල ප්‍රයෝජන නොමැති අධික සුඛෝපභෝගී වාහන බැහැර කිරීමට කටයුතු කරමින් සිටින බවත් ප්‍රකාශ කරන ලදී. තවද, ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ පැහැදිලි ස්ථාවරත්වය මෙම දීමනාව වැඩිවිය යුතුයි. හැබැයි ඒ ඒ සඳහා මෙම උචිත අවස්ථාව නොවන බවත් නැවතත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ගෝෂා
සභාපතිතුමන් විසින් සමථයකට පත් කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ලෝක වෙළෙඳපළ මිල වෙනස්වීමත් සමග රටේ පවතින මිල පාලනය කර ගත නොහැකි නම් රජයක් අවශ්‍ය නොවන බව විපක්ෂය තර්ක කළ බවත්, නමුත් මේ වන විට පෙට්‍රල් ලීටරයකින් රු 100.00 ක් ද ඩීසල් 20.00 ක්ද ආණ්ඩුව දරන බවත්, තෙල් පෝළිම් ක්‍රමය පැවතුනේ වත්මන් ආණ්ඩුව විසින් නොකඩවා තෙල් සැපයුම සිදුකිරීමට කටයුතු කරන බවත්, හෙට සිට බදාදා රජයේ නිවාඩු දිනය අවලංගු කර පවතින්නේද තෙල් සැපයුම ස්ථාවර කර ගැනීමට හැකි වූ බැවින් බවත් ප්‍රකාශ කරන ලදී. තවද, අද පවතින්නේ ලෝක අර්බුදයක් බවත්, එදා පැවතුණේ ලංකාවේ අර්බුදයක් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.ඒ වගේම නුවරට දුම්රිය ගමනාගමනය තවම සිදු නොවීම සම්බන්ධව විපක්ෂය චෝදනා කළ බවත්,මේ වන විට එම දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කරමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.
මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතී ද යන්න විමසු අතර බෙදීමකට යාමට අවශ්‍යතාව පැන නැගී ඇති බැවින් ඡන්දයකට යාම සුදුසු බව ප්‍රකාශ කළ අතර රු.100.00 ක් දීමනාව වැඩිකිරීම සම්බන්ධව ඡන්දය විමසන ලදී.

සභාගර්භයේ ගෝෂා
රු.100.00 වැඩි කිරීම සම්බන්ධව පක්ෂව ඡන්ද 15 ද විපක්ෂව ඡන්ද 18 ද ලැබුණ අතර ඒ අනුව වැඩි ඡන්ද 03 න් අදාළ යෝජනාව ප්‍රතික්ෂේප වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
අදාළ යෝජනාව වැඩි ඡන්ද 03 න් ප්‍රතික්ෂේප වන ලදී.

**(ඊ).04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා**

i. දැනට සභාවට අයිති නොවන පොදු ළිං සභාවට පවරා ගැනීමට සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා**

තමාගේ කලාපය තුළ (වල්ගම) පොදුවේ භාවිතා කරන ළිං 23 පවතින බවත්, නමුත් සභාව සතුව ඇත්තේ ඉන් ළිං 04 බවත් ප්‍රකාශ කරන ලදී. තවද,දැඩි නියං කාලයේදී පවා මෙම ළිංවල ජලය පවතින බැවින් ප්‍රජා ජල ව්‍යාපෘතියක් වසම් මට්ටමින් ක්‍රියාත්මක කළ හැකිනම් අපතේ යන ජලයට නව පණක් ලබාදීමට හැකි වන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පොදු ළිං ලෙස අදහස් කරන්නේ කුමන ළිං ද යන්න පැහැදිලි කිරීමක් අපේක්ෂා කළ බවත්, ප්‍රජා ජල ව්‍යාපෘති කිරීම සම්බන්ධව එතුමා පැහැදිලි කිරීමක් සිදුකළ ද මහජනතාව පොදුවේ භාවිතා කරන ළිං පොදු ළිං ලෙස සැලකුවද ඒවා පෞද්ගලික ඉඩම්වල පවතින බවත්, ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යාමේදී මෙම ළිං රජයට පවරාගත යුතු වන බවත්, ඒ සඳහා විශාල මුදලක් වැය වන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙම යෝජනාව ඉතා කාලෝචිත වටිනා යෝජනාවක් බවත්, පසුගිය කාලයේ අතරමඟ නවතා තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති 175 ක් මේ වන විට ආරම්භ කිරීමට කටයුතු සිදුකර ඇති බවත්, ඉන් එකක් ලෙස 2014 වර්ෂයේ රඹුක්කන ප්‍රදේශයේ නවතා තිබූ ජල ව්‍යාපෘතියක් මේ වන විට ආරම්භ කර ඇති බවත්, ග්‍රාමීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති බැවින් ඒ සඳහා ජල මූලාශ්‍ර සොයා ගත යුතු බවත්, ගංගා, ඇළ ,දොළ හා පොදු ළිං ඒ සඳහා පාදක කරගත හැකි බවත්, රඹුක්කන ආසනයේ වසම් 20 කට පමණ ජලය නොමැති කමින් පවුල් විශාල ප්‍රමාණයක් පීඩාවට පත්ව සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

පරිණත යැයි කියන දේශපාලනඥයින් විසින් රජයේ දේපළ අයතා ලෙස පරිහරණය කරන අවස්ථාවක මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා මෙවැනි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යාම හෑල්ලුවට ලක් කිරීමට තරම් විපක්ෂ මන්ත්‍රීවරුන් කුහක වීම ගැන කණගාටු වන බවත්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ජල මූලාශ්‍ර සොයා ගැනීමට යාම අහක ඉන්න නයි රෙද්ද අස්සේ දා ගැනීමට තරම් විහිළු සහගත ක්‍රියාවක් වන්නේ කෙසේද යන්න විමසන ලද අතර ළිං සභාවට අත්පත් කර ගැනීමට පෙර ජල මූලාශ්‍ර හඳුනාගත යුතු බවත්, ඉන් වටිනාම මූලාශ්‍රය පවරා ගැනීම මින් අදහස් කරන්නට ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

සර්වෝදය වැඩසටහන යටතේ ගම් මට්ටමින් ළිං සංවර්ධනය කර ඇති බවත්, සභාව සතු පොදු ළිං පවතින බවත්, පෞද්ගලික හිමිකාරීත්වය සතු ඉඩම් වල පවතින ළිං අත්පත් කර ගැනීමට ගියහොත් එම ළිඳට යාමට මාර්ගය සකස් කිරීමටද සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී.
ජල මූලාශ්‍ර වලට මෝටර් යොදා ජලය ගැනීමත් සමඟ ඊට පහළින් ඇති වගාබිම් මුඩු ඉඩම් බවට පත්විය හැකි බවත්, ජල මූලාශ්‍ර තෝරා ගැනීමේදී ඒ ගැන අවධානය යොමු කළ යුතු බවත්, සභාව සතු පොදු ළිං පවති නම් ඒවා අලුත්වැඩියා කර නඩත්තු කරනවා නම් ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ප්‍රථමයෙන්ම මහජනතාවගේ ජල අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කිරීම සම්බන්ධව ස්තුති පුද කරන බවත්, උපසභාපතිතුමනි,මේ වසර තුළ ළිං 100 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කළහොත් අවම වශයෙන් නඩු 95 ක් වත් සභාවට විරුද්ධව ගොනුවනු ඇති බවත්, ලයනල් මන්ත්‍රීතුමා අදහස් කළ පරිදි මුලින්ම ජල මූලාශ්‍ර හඳුනාගත යුතු බවත්, රඹුක්කන කොට්ඨාශය පුරා පොදු ළිං ලෙස ළිං 25 ක් වත් නොමැති බවත්, සභා වපසරිය ගැන කරුණු කාරණා අවබෝධ කරගෙන මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ගැන ඉන්දික මන්ත්‍රීතුමන්ට ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඉන්දික මන්ත්‍රීතුමාගේ සංඛ්‍යා ලේඛන අනුව පොදු ළිං 24 පවතින බවත්, ඉන් 04 ක් සභාව සතු බවත් ප්‍රකාශ කළ අතර "මොකාගෙන් කාලා හරි මට තාත්තේ කියපන් "කියන ගැමි කියමන සභාවට ප්‍රකාශ කළ අතර, සභා අරමුදල් වියදම් කළ හැක්කේ සභා දේපළ සඳහා පමණක් බවත්, පෞද්ගලික හිමිකාරීත්වය සතු ජල මූලාශ්‍ර පොදු පරිහරණයට ලබා දුන්නද ඒවා සංවර්ධනය කිරීමට යාමේදී සභාව සතු කර ගතයුතු බවත්, එවිට ගැටළු ඇතිවන බවත්, සභා සතු ළිං පමණක් සංවර්ධනය කිරීමට සභා අනුමැතිය ලබාදීම සුදුසු බවත්, අනවශ්‍ය ප්‍රශ්න ඇති නොවන ලෙස කටයුතු කිරීම සුදුසු බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.මල්ලිකා මැතිතුමිය**

පුවක්මොටේ වසමේ ළිං 02 ක් පවතින බවත්, ඉන් එකක් මේ වන විට ප්‍රතිසංස්කරණය කර තිබෙන බවත්, ගල් ළිඳ නමින් හැඳින්වෙන අනෙක් ළිඳ සංවර්ධනය කළ හැකි නම් ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

ඉන්දික මන්ත්‍රීතුමාගේ මෙම යෝජනාවෙන් අදහස් කරන්නේ හොඳින් හෝ නරකින් මෙම ළිං අත්පත් කර ගැනීමක් නොවන බවත්, පරිණතයි කියාගන්නා පද නරින්ට එය තේරුම් ගත නොහැකි වීම ගැන කනගාටුව ප්‍රකාශ කරන බවත්, ප්‍රකාශ කරන ලදී.

සභා ගර්භයේ ඝෝෂා

සභාපතිතුමන් විසින් එය සමථයකට පත් කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විෂයට අනුව තම අදහස් ප්‍රකාශ කරන ලෙසත්, අපහාසාත්මක වචන භාවිතා නොකරන ලෙසත්, එක් මන්ත්‍රීවරයකු අදහස් ප්‍රකාශ කිරීමේදී බාධා නොකරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

ගම්වල පරිත්‍යාගශීලී මිනිසුන් සිටින බවත්, එම පුද්ගලයින්ගෙන් අදාළ ළිං පවරා ගැනීමට කටයුතු කර මහජනතාවට මහඟු සේවාවක් ලබාදීමට හැකියාව පවතින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ජල යෝජනා ක්‍රම පවතී නම් ඊට අදාළව පහත කොන්දේසි වන

- ➢ ඉඩම අයිති පුද්ගලයාට එම ළිඳ සභාවට පැවරීමට කැමැත්ත දැක්වීමේ ලිපිය,
- ➢ අදාළ ළිං වෙත ප්‍රවේශ වීමේ මාර්ගය දැක්වෙන පිඹුර,
- ➢ ව්‍යාපෘති වාර්තාව

සපුරා තිබිය යුතු බව ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාවය පැන නොනැගී හෙයින් අදාළ යෝජනාව ඉහත කොන්දේසි වලට යටත්ව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

ජල අවශ්‍යතාවය පවතින බැවින් පහත කොන්දේසි සපුරාලන ව්‍යාපෘති සභාවට පවරාගැනීමට තීරණය විය.

- ➢ ඉඩම අයිති පුද්ගලයාට එම ළිඳ සභාවට පැවරීමට කැමැත්ත දැක්වීමේ ලිපිය,
- ➢ අදාළ ළිං වෙත ප්‍රවේශ වීමේ මාර්ගය දැක්වෙන පිඹුර,
- ➢ ව්‍යාපෘති වාර්තාව

**(ඊ).05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා**

i. **බතඹුරය ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාංගනයේ සඳහන්ව ඇති "මහීපාල හේරත් ක්‍රීඩාංගනය" යන නාමය ඉවත් කර එහි පැරණි නාමය වන "බතඹුරය ක්‍රීඩාංගනය" යන නාමය යෙදීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

- **ප.ව.1.33ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා සභාගර්භයෙන් ඉවත්ව යන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

මහජනතාවගේ දේපළක් මහජනතාවගේම මුදලින් සංවර්ධනය කර එහි නාමය වෙනස් කිරීම කාලෝචිත නොවන බව ප්‍රකාශ කරන ලදී. එම නිසා එහි පැරණි නාමය ලබාදීම සුදුසු බවත්, මෙසේ මෙතුමාගේ නම යෙදීමටත් එතුමාට කරන අගෞරවයක් බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

සබරගමු පළාත් සභාවටම මහඟු සේවාවක් කළ පුද්ගලයකුගේ නාමයක් එහි පවතින බවත්, නවක දේශපාලඥයින් ඒ සම්බන්ධව නොදැනුවත් බවත්, කුහක දේශපාලනයකට යා යුතු නොවන බවත්, අනාගතය ගැන සිතා යෝජනා ඉදිරිපත් කරන ලෙසත්, මෙම යෝජනාවට තමා විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය**

සබරගමු පළාතටම වැඩක් කළ පුද්ගලයෙකු බවත්,ඔහුට තාමත් ගම්වල මිනිසුන් ගරු කරන බවත් ප්‍රකාශ කළ අතර මෙම යෝජනාව තමා ද විරුද්ධ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

සර්වජන පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් දෙදෙනෙකු සිටින බවත්, මෙම යෝජනාවට තම පක්ෂය විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙය වෛරී දේශපාලනයක්වත් කුහක දේශපාලන න්‍යායක්වත් නොවන බවත්, ක්‍රීඩාංගනයේ නාමය තිබූ තැනටම ආපස්සට යාමක් පමණක් බවත් ප්‍රකාශ කරන ලදී. සභාවේ බොහෝ ලිඛිත කටයුතුවලදී මෙහි පැරණි නාමයම භාවිතා වන බැවින් නව නාමයත් සමඟ ගැටීම් ඇති වී ඇති බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරන ලදී. තවද, එතුමාගේ දේශපාලන කාලය තුළ මහජනතාවට මෙම ප්‍රදේශයට මහඟු සේවාවක් ඉටුකළ බව සැබෑ වුවද එම මුදල තම පෞද්ගලික මුදල් නොවන බවත්, එම මුදල් මහජනතාවගේ මුදල් බවත් ප්‍රකාශ කරන ලදී.

තවද මහීපාල හේරත් මැතිතුමා බතඹුරය ක්‍රීඩාපිටියට මුදල් වෙන්කර ගන්න ඇති රජයෙන් නමුත් එතුමාගේ පෞද්ගලික මුදල් මේ සඳහා යොදවා ඇති බව කිසිවක සඳහන් වී නොමැති බවත්, අශෝක මහතා තම පෞද්ගලික දේපළ විශාල ප්‍රමාණයක් රජයට පරිත්‍යාග කර ඇති බවත්, ඒ නිසා එතුමාට ගෞරවයක් විදිහට එතුමාගේ නම යොදා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

බතඹුරය ක්‍රීඩාංගණය නවීකරණය කර එම නම යොදා ඇති බවත්, ජාත්‍යන්තර ක්‍රිකට් තරඟ පැවැත්වීමට තරම් උචිත පරිදි ක්‍රීඩාංගනය නවීකරණය කර නම වෙනස් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. නම වෙනස් කිරීමට ඇති අවශ්‍යතාවය කුමක්ද යන්න විමසන ලදී. තවද, නම වෙනස් කිරීමට නොව ඊට වඩා වැදගත් බොහෝ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගොනා හැරෙන්නේ පොල් පැළේ කන්න වගෙයි කියා ප්‍රකාශය කරන ලදී. මෙහි යටි අරමුණ බණ්ඩාරනායක සම්මන්ත්‍රන ශාලාවේ නම වෙනස් කිරීමට දෝ සැකයක් පැන නගින බවත් ප්‍රකාශ කරන ලදී. මහජනතාවට සෙතක් සලසන වැඩක් ඇති දෙයක් කිරීමට කටයුතු කිරීම ඉතා වටිනා බවත්, වෛරී දේශපාලනයෙන් තොරව කටයුතු කරන ලෙසත්, මෙම ක්‍රීඩාංගනයට වැඩක් සිදුකර එහි නම වෙනස් කිරීමට යෝජනා කිරීම කාලෝචිත බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මහීපාල ඇමතිතුමා

- සබරගමුව මහඇමති,
- නිවාස සංවර්ධන නියෝජ්‍ය ඇමත්‍යවරයා,

- සබරගමු ආණ්ඩුකාර,
- උතුරු මැද ආණ්ඩුකාර.............ආදී ලෙස තනතුරු දැරූ පුද්ගලයකු බවත්, සබරගමුවට දැවැන්ත මෙහෙවරක් සිදුකළ පුද්ගලයකු බවත්, දේශපාලන හැකියාව හා දක්ෂතාවය මත මහජන මුදල් ප්‍රතිප්‍රතිපාදන ලෙස වෙන්කර ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී. දේශපාලනයේ යෙදීමේදී කුහකත්වය වෛරය අදාළ කර ගත යුතු නොවන බවත් ප්‍රකාශ කරන ලදී. මහීපාල ක්‍රීඩාංගනය යන නාමය යෙදීමට මහසභා අනුමැතිය ලබා ගැනීමට න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබූ බවත්, ඒ අනුව ආණ්ඩුකාර අනුමැතිය ලබාගෙන එම නාමය යොදා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

විශේෂයෙන්ම බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවෙහි නාමයට පහර ගැසීමට අඩිතාලමක් ලෙස මෙය වැටහෙන බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මහීපාල හේරත් යන නාමය ඉවත් කිරීමට අවශ්‍ය නම් ක්‍රීඩාංගනයේ පමණක් නොව තවත් සංවර්ධන ව්‍යාපෘති ගණනාවකගේම මෙම නාමය ඉවත් කිරීමට සිදුවන බව ප්‍රකාශ කරන ලදී.

### ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා

සන්නිවේදන ප්‍රශ්නයක් පවතින බවත්, කුහක දේශපාලනයක් ලෙස මෙය හැඳින්වීම ගැන තමා විරුද්ධ බවත්, පොදු දේපළක් එක් පුද්ගලයකුට පවරා දීමක් සිදුවී ඇති බවට සමාන බව එනම් මහජන මුදලින් නඩත්තු කළ දේපළක් එක පුද්ගලයකුගේ නාමයෙන් ප්‍රසිද්ධ කිරීම කොතරම් සදාචාර සම්පන්නද යන්න විමසන ලදී.

සභාගර්භයේ ඝෝෂා

### ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා

වැඩිහිටි පරිණත දේශපාලනයින් ලෙස නීති රීති අනුගමනය කර කටයුතු කරන ලෙසත්, ජ්‍යෙෂ්ඨ භාවය රෙද්ද පල්ලෙන් බේරෙන බවට ඔප්පු නොකර නවක දේශපාලඥයින්ට හරි වැරැද්ද පෙන්නා දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

අශෝක මහතා ඔහුගේ නම ප්‍රසිද්ධ කරගෙන ඇත්තේ තම පෞද්ගලික මිල මුදල් හා දේපළ විශාල ප්‍රමාණයක් රජයට පරිත්‍යාග කර බවත්, එහි ගැටළුවක් නොමැති බවත්, නමුත් මහජන මුදලින් සංවර්ධන කටයුතු සිදුකර මෙසේ නම වෙනස් කිරීම උචිත නොවන බවත්, ගරු සේවය යන්න මහජනතාවගේ හදවතේ ගොඩනැගුණු දෙයක් බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා

### ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා

කුහක දේශපාලනය යන්නට හොඳම උදාහරණය ලෙස පෞද්ගලික ව්‍යාපාරික ස්ථානවලට තම නාමය නොයොදවා මහජනතාවගේ පොදු දේපළවලට තම නාමය යෙදීම බව ප්‍රකාශ කරන ලදී. මහජන මුදලින් සංවර්ධනය කරන ලද්දක් ලෙස සටහන් කිරීම කොතරම් දුරට අගනේ ද යන්න විමසන ලදී.

### ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා

පෙර පැවැති රජයන් විසින් සිදුකළ ක්‍රියාකාරකම් සිදුකිරීමට නොහැකි වීම මත හිත්වේදනාව ඇති වී මෙසේ කටයුතු කරන බවත්, පවතින්නේ නව දේශපාලන දැක්මක් ක්‍රියාත්මක කිරීමට පැමිණ තිබෙන රජයක් බවත්, මහජනතාවගේ සුබ සිද්ධිය උදෙසා සිදුකළ හැකි උපරිම දේ සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

### ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා

වල්පැළ ගලවා මල් පැළ සිටුවලා දැන් එලදාව ඇවිත් තිබෙන බවත්, හැබැයි මල් වලින් සුවඳ වෙනුවට දුගඳ හමන බවත් ප්‍රකාශ කරන ලදී. තවද,සභා යෝජනා ස්ථිරත්වයකින් මෙම නම යොදා ඇති බවත්, එතුමාට මඩ ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධව තමාගේ විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම මහජනතාවට යමක් කරලා එතුමා නම යොදාගෙන තිබෙනවා සේම ඔබතුමන්ලාද මහජනතාවට සේවාවක් සිදු කර තම නම යොදා ගැනීම සම්බන්ධව තමාගේ විරුද්ධත්වයක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.මුළු රටටම සේවාව සිදු කළ බවත්, පිදිය යුත්තන් පිදිය යුතු බැවින් මෙම යෝජනාවට තමා විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
දේශපාලනය යන මඩ ප්‍රහාරය මල් මාලා ආදිය ලැබෙන තැනක් බවත්, මෙම යෝජනාව සම්බන්ධව අනවශ්‍ය ලෙස කාලය ගතවී ඇති බැවින් බෙදීමකට යාම සුදුසු බව ප්‍රකාශ කළ අතර පැරණි නාමය යෙදීම සම්බන්ධව ඡන්දය විමසන ලදී.

පක්ෂව ඡන්ද 17 ද විපක්ෂව ඡන්ද 14 ක් ද ලැබුණ අතර ඒ අනුව අදාළ යෝජනාව වැඩි ඡන්ව 03 න් සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

1) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
2) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -කේ.සී.සරත් කුමාර මැතිතුමා
3) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
4) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී -එච්.ආර්.ප්‍රදිපා රංජනී මැතිතුමිය
5) ජී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී -ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය යන අය ප.ව.2.14 ට සභාගර්භයෙන් ඉවත්ව යන ලදී.

තීරණය -
“මහීපාල ක්‍රිඩාංගනය” යන නාමය ඉවත් කර එහි පැරණි නාමය වන “බතඹුරය ක්‍රීඩාංගනය” යන නාමය යෙදීමට ආණ්ඩුකාර අනුමැතිය ලබා ගැනීමට තීරණය විය.

**(ඊ).06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා (කාර්මික සේවා කමිටු - සභාපති)**

**i. මිනිලෝඩරයක් මිලදී ගැනීම සම්බන්ධව මිල ගණන් කැඳවිය යුතු බවට කාර්මික සේවා කමිටුව විසින් නිර්දේශ කර ඇති අතර ඒ සඳහා මිල ගණන් කැඳවීමටත්,මිල දී ගැනීමත් සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
සභාව සතු බොක්කැට් යන්ත්‍රය මේ වන විට අක්‍රියව පවතින බවත්, දිගින් දිගටම අලුත්වැඩියා සිදුකළ ද එය ඵලදායි නොවූ බවත්, මෙම යන්ත්‍රය සභාව මිලට ගෙන වසර 15කටත් අධික බවත්, එහි ඵලදායිතාවය මේ වන විට ශුන්‍ය මට්ටමක පවතින බවත්, කසල අංගනයේ කසල ගොඩ ගැසෙන බැවින් මිනි ලෝඩරයක් කුලී පදමනට ගැනීමට මිල ගණන් කැඳවීම සුදුසු බව කාර්මික සේවා කමිටු තීරණය කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
මෙම බොක්කැට් යන්ත්‍රය වර්තමාන තත්ත්වයට පත්වීමට ප්‍රධානතම හේතුව එය හැසිරවීම සම්බන්ධව දැනුම ඇති රියදුරකු නොමැති වීම බව පැහැදිලි කළ අතර නැවත එවැන්නක් සිදු නොවීමට පුහුණු රියදුරකුද ඒ සඳහා සපයා ගනිමින් නව රථයක් මිලට ගැනීමට යාම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාවය පැන නොනැගි හෙයින් අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
කාර්මික කමිටු සභාපතිගේ මැදිහත්වීම මත නව මිනිලෝඩරයක් මිලදී ගැනීමට අවශ්‍ය පිරිවිතර ඉදිරිපත් කරන ලෙසත්, ඒ අනුව මිලදී ගැනීම සිදුකිරීමට තීරණය විය.

**ii. සභාවේ මුදල් වලින් බොබ්කැට් යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
නඩත්තු වියදම අධික බැවින් පවතින බොක්කැට් යන්ත්‍ර අපහරණය කර නව යන්ත්‍රයකට යාම මඟින් වැඩි කාර්යක්ෂමතාවයක් ඇති කර ගත හැකි බවත්, පවතින රජය මඟින් නව යන්ත්‍ර උපකරණ ලැබෙනවා නම් මිලදී ගැනීමකට නොයා කුලී පදනමට සපයා ගැනීම සුදුසු බවත්, කාර්මික සේවා කමිටු තීරණය බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
සභාවට අත්‍යවශ්‍ය යන්ත්‍රයක් බැවින් කාර්මික කමිටු සභාපතිතුමාගේ මැදිහත්වීමෙන් නව යන්ත්‍රයක් මිලදී ගැනීමට අවශ්‍ය පිරිවිතර හැකි ඉක්මනින් සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදී.
ඒ අනුව කමිටු යෝජනාවට අදාළ තීරණය සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර විරුද්ධත්වයක් පැන නොනැගි බැවින් ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
කාර්මික කමිටු සභාපතිගේ මැදිහත්වීම මත නව බොක්කැට් යන්ත්‍රයක් මිලදී ගැනීමට අවශ්‍ය පිරිවිතර ඉදිරිපත් කරන ලෙසත්, ඒ අනුව මිලදී ගැනීම සිදුකිරීමට තීරණය විය.

**(ඊ).07.ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

**i. රඹුක්කන කෙසෙල්කැන් පොළ විධිමත් කර නවීන කෙසෙල්කැන් පොළකට අදාල වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවට ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
මේ වසර අග වන විට වැලිගමුවෙන් අධිවේගී මාර්ගය විවෘත වන බවත්, ඊට සමගාමීව රඹුක්කන නගරය කාර්ය බහුල වන තැනක් වන බව නොඅනුමාන බවත්, විශේෂයෙන්ම දුම්රිය මාර්ගයක් නගරය හරහා වැටී ඇති බැවිනුත් එයද ඉතා වාසි සහගත තත්ත්වයක් බවත්, මෙම ආර්ථික වාසිය උපයෝගී කරගෙන අපට නැති වී ගිය රඹකැන් නාමය නැමැති ලබා ගැනීමට පියවරක් ලෙසම නවීන පහසුකම් වලින් යුත් ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම කාලෝචිත බවත්, නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් ලබා ගෙන සභික මණ්ඩලයේ අදහස් ලබාගෙන රඹකැන් නාමය නැවතත් ඉදිරියට ගෙනයාම මින් අදහස් කළ බව ප්‍රකාශ කරන ලදී.

- ප.ව 14.27 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා සභාගර්භයෙන් පිටත්ව යන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
ගරු උපසභාපතිතුමාගේ තනතුරට ගරු කිරීමක් ලෙස එතුමාගේ යෝජනාව න්‍යාය පත්‍රයේ ගරු සභාපතිතුමන්ගේ යෝජනාවට පසුව ගරු උපසභාපතිතුමන්ගේ යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
උප සභාපතිතුමන්ගේ යෝජනාව ඉතා වටිනා බවත්,මෙම සභා භූමිය පෙර කෙසෙල්කැන්පොළ බවත්, ඊට ගරු කිරීමක් ලෙස නවීන අංගෝපාංගයන්ගෙන් යුත් ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වටිනා යෝජනාවක් බැවින් උප සභාපතිතුමන්ගේ මැදිහත්වීම හා පරිසර කමිටු අධීක්ෂණය මත ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව ලබන සභාවාරයට ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී. අදාළ යෝජනාව සම්බන්ධයව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර විරුද්ධත්වයක් පැන නොනැගි බැවින් ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

නවීන අංගෝපාංගයන්ගෙන් යුත් ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය.

**(ඊ).08.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

i. **රඹුක්කන ආසනය ආවරණය වන පරිදි ආධුනික ගීත තරගාවලියක් පැවැත්වීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ප්‍රදේශයේ සිටින දරුවන්ගේ දක්ෂතා ඔප්නැංවීමට මෙය ඉතා වටිනා අවස්ථාවක් බව ප්‍රකාශ කරන ලදී. තවද,මෙවැනි යෝජනා කීහිපවරක්ම ඉදිරිපත් කළ බවත්, සභා අනුමැති ලැබුණු බවත්,නමුත් ක්‍රියාත්මක නොවීම ගැන කණගාටුව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

යෝජනා ඉදිරිපත් කර ස්ථිර කර ගැනීම කළ හැකි නමුත් එය ක්‍රියාවට නැංවීම සිදු කළ යුත්තේ ද අදාළ යෝජනාව ඉදිරිපත් කළ තැනැත්තාගේ මූලිකත්වය මත බවත් ප්‍රකාශ කරන ලදී. අදාළ යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර විරුද්ධත්වයක් පැන නොනැගි බැවින් ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රඹුක්කන ආසනය ආවරණය වන පරිදි ආධුනික ගීත තරඟාවලියක් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමාගේ මූලිකත්වයෙන් පැවැත්වීමට තීරණය විය.

ii. **පින්නවල වාගොල්ල ඉදිකරන ලැබූ හොටෙල් පාසල් ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ආයතන දැනුවත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පෙර පැවැති රාජ්‍ය සමයේදී මෙම ස්ථානයේ විශ්වවිද්‍යාලයක් ආරම්භ කර ගැනීමට උත්සාහයක් දැරුවද එය අසාර්ථක වූ බවත්, හොටෙල් පාසලක් ලෙස මෙම ගොඩනැගිල්ල වසර කිහිපයක් තිස්සේ නිශ්ඵල ලෙස පවතින බැවින් එය ඵලදායී භූමියක් ලෙසට පත් කළහොත් ඉතා වටිනා බවත්, මහජන මුදලින් ඉදිකළ ස්ථානයක් බවත් මහජන මුදල් අපතේ යැවීම කණගාටුදායක බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

- ප.ව.14.35 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා සභාගර්භයෙන් පිටත්ව යන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙම යෝජනාව අගය කළ යුතු බවත්, මෙම ගොඩනැගිල්ල ඌණ උපයෝගීතා ගොඩනැගිල්ලක් බවත්, මේ සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී දිගින් දිගටම සාකච්ඡාවට පත් වූ බවත්, ඊට එපිටින් තිබෙන ඇවිදින මන්තීරුවත් එකට එක් කර සංචාරක කලාපයක් නිර්මාණය කිරීමට අදහස් කර ඇති බවත් පැහැදිලි කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා ක්‍රියාවට නැංවෙන බැවින් සභා තීරණයක් අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරන ලදී.

**(ඊ).09.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

i. සුළු නගර සභා ක්‍රමය යටතේ අප සභාවට අයිතිව තිබූ ප්‍රාදේශීය සභා ඉඩම් කොටස් සමහර කඩ හිමියන් නීති විරෝධීවර අල්ලාගෙන ඇති බැවින් එම ඉඩම් කොටස් නැවත අප සභාව යටතේ පාලනයට ලබා ගත යුතු බවටත්, ඒ සම්බන්ධව කටයුතු කරදෙන මෙන් සබරගමුව පළාත් පාලන ලේකම්තුමා දැනුවත් කර ලිපියක් යැවීමට යෝජනා කරමි.

ii. විටින් විට අසනීප ගතියට පාත්‍රව සිටින මා මසකට වාර හතරක් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට සහභාගී වීමට අසීරු තාවයකට පත්ව ඇත. මා වෙනත් කමිටුවකට පත්කර දෙනමෙන් යෝජනා කරමි.

ඊළඟ සභා වාරයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි බව ප්‍රකාශ කරන ලදී.

**යථා පරිදි කල් දී නොමැති යෝජනා**

## (ඊ).01.II.01

රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසල් ගොඩනැඟිල්ලේ ඉදිරිපස බිම් සකස් කිරීම සඳහා කාර්මික නිලධාරි විසින් සකස් කරන ලද රු.100,000.00 ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගී බැවින් ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසල් ගොඩනැඟිල්ලේ ඉදිරිපස බිම් සකස් කිරීම සඳහා සකස් කරන ලද රු.100,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

## (ඊ).01.II.02

රඹුක්කන ප්‍රාදේශීය සභා සතු පෞද්ගලික බස්රථ නැවතුම්පළ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කළ අතර 2026.03.30 දින එම වාර්තාව (වාර්ෂික බදු කුලීය රු.240,000.00 කි) අප වෙත ලැබී ඇත.එහෙයින් එම ආයතනය සමඟ ගිවිසුම්ගත නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට හා ක්‍රියාත්මක කරනුයේ කවර දා සිටද යන්න සහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ  අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නව තක්සේරුව අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක කිරීමට සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගී බැවින් ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු පෞද්ගලික බස්රථ නැවතුම්පළ සඳහා නව තක්සේරුව අනුව වාර්ෂික බදු කුලී ලෙස රු.240,000.00 ක් 2026.04.01 දින සිට අය කිරීමට එම ආයතනය සමඟ ගිවිසුම්ගත වීමට තීරණය විය.

(උ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවේලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස, ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026.02.26 දින පැවති පරිසර හා පහසුකම් සැපයීමේ කාරක සභා වාර්තාව, හා 2026.02.18 සහ 2026.03.10 දින පැවති කාර්මික සේවා කමිටු කාරක සභා වාර්තා සම්බන්ධ ගැටලුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලද අතර ගැටලුවක් මතු නොවූ බැවින් පිළිගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

2026.02.26 දින පැවති පරිසර හා පහසුකම් සැපයීමේ කාරක සභා වාර්තාව, හා 2026.02.18 සහ 2026.03.10 දින පැවති කාර්මික සේවා කමිටු කාරක සභා වාර්තා පිළිගැනීම සුදුසු බවට තීරණය විය.

(ඌ). ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

මාර්තු මස - ලැබීම්

| | **පොදු පරිපාලනය** | **සෞඛ්‍ය සේවා** | **භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි** | **වෙනත් උපයෝගී සේවා** | **සුභ සාධන සේවා** | **මුළු එකතුව** |
|---|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **5** | **6** | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 10 වරිපනම් බදු | 417,641.77 | 358,400.00 | - | - | 18,337.72 | 794,379.49 |
| 20 කුලී | - | 17,415.00 | 238,830.00 | 1,092,550.50 | 53,584.13 | 1,402,379.63 |
| 30 බලපත්‍ර සේවා | 22,204.00 | 49,000.00 | 361,630.00 | - | - | 432,834.00 |
| 40 සේවා සඳහා ගාස්තු | - | 391,886.78 | 1,421,832.10 | - | 3,815.00 | 1,817,533.88 |
| 50 වරෙන්තු සඳහා ගාස්තු | 175,032.50 | - | - | 99,029.00 | 3,320.00 | 277,381.50 |
| 60 වෙනත් ආදායම් | 71,590.36 | 70,950.00 | 62,250.00 | - | 1,580.00 | 206,370.36 |
| 70 වෙනත් ආදායම් | 3,539,208.83 | 1,372,331.60 | 1,327,097.60 | 51,247.35 | 488,104.66 | 6,777,990.04 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **4,225,677.46** | **2,259,983.38** | **3,411,639.70** | **1,242,826.85** | **568,741.51** | **11,708,868.90** |
| ප්‍රාග්ධන ආධාර 3-80 | - | - | - | - | - | - |
| එකතුව | - | - | - | - | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් වල එකතුව** | **4,225,677.46** | **2,259,983.38** | **3,411,639.70** | **1,242,826.85** | **568,741.51** | **11,708,868.90** |
| සේවක ණය | | | | | | - |
| මහජන බැංකුව -සේවක ණය | 127,850.00 | | | | | 127,850.00 |
| ලංකා බැංකුව -සේවක ණය | 387,257.42 | | | | | 387,257.42 |
| ලංකා බැංකුව 0008502324 | - | | | | | - |
| මහජන බැංකුව 101-1001-05116620 | - | | | | | - |
| තැන්පත් | 9,080,969.70 | | | | | 9,080,969.70 |
| සමුච්චිත අරමුදල | 725.00 | | | | | 725.00 |
| ශීර්ෂ ආදායම | 4,343.00 | | | | | 4,343.00 |
| අත්තිකාරම් | 27,270.00 | | | | | 27,270.00 |
| ආයෝජන ආපසු ලැබීම් | - | | | | | - |
| වෙනත් ලැබීම් | - | | | | | - |
| මුළු එකතුව | **13,854,092.58** | **2,259,983.38** | **3,411,639.70** | **1,242,826.85** | **568,741.51** | **21,337,284.02** |

මාර්තු මස - වැය සාරාංශය

| | **පොදු පරිපාලනය** | **සෞඛ්‍ය සේවා** | **භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි** | **වෙනත් උපයෝගී සේවා** | **සුභ සාධන සේවා** | **මුළු එකතුව** |
|---|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **5** | **6** | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 01 වැටුප් දීමනා | 4,728,833.32 | 1,927,319.57 | 1,742,789.09 | 61,702.00 | 617,038.00 | 9,077,681.98 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 02 ගමන් වියදම් | 45,200.66 | 9,768.00 | 25,789.00 | - | - | 80,757.66 |
| 03 සැපයුම් හා උපකරණ | 59,896.40 | 343,230.00 | 172,720.00 | 52,630.00 | - | 628,476.40 |
| 04 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 190,120.00 | 318,890.06 | 139,040.00 | - | - | 648,050.06 |
| 05 ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යතා හා වෙනත් සේවා | 329,247.79 | 54,050.37 | - | 105,404.56 | 9,044.21 | 497,746.93 |
| 06 පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | | | - | 2,344.36 | 1,611.47 | 3,955.83 |
| 07 ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 13,180.63 | 2,584.14 | - | - | - | 15,764.77 |
| 08 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 20,009.16 | | - | - | - | 20,009.16 |
| 09 තක්සේරු ගාස්තුව | - | - | - | - | - | - |
| **පුනරාවර්තන වියදම් එකතුව** | **5,386,487.96** | **2,655,842.14** | **2,080,338.09** | **222,080.92** | **627,693.68** | **10,972,442.79** |
| 09 ප්‍රාග්ධන වැය | - | | | - | - | - |
| 10 ණය ආපසු ගෙවීම් | - | | | - | - | - |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **-** | **-** | **-** | **-** | **-** | **-** |
| **පුනරාවර්තන වැය හා ප්‍රාග්ධන වියදම් වල මුළු එකතුව** | **5,386,487.96** | **2,655,842.14** | **2,080,338.09** | **222,080.92** | **627,693.68** | **10,972,442.79** |
| **සේවක ණය** | | | | | | |
| මහජන බැංකුව | 270,400.00 | | | | | 270,400.00 |
| ලංකා බැංකුව | 500,000.00 | | | | | 500,000.00 |
| ලංකා බැංකුව 8502324 | | | | | | - |
| තැන්පත් | 8,024,754.22 | | | | | 8,024,754.22 |
| විවිධ ණය හිමියෝ | 607,861.62 | | | | | 607,861.62 |
| ගබඩා ණය හිමියෝ | 827,451.50 | | | | | 827,451.50 |
| අත්තිකාරම් | 1,337,530.00 | | | | | 1,337,530.00 |
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ආයෝජන | - | | | | | - |
| වෙනත් ගෙවීම් | | | | | | - |
| **මුළු එකතුව** | **11,567,997.34** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **22,540,440.13** |

**(එ).**සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම -නැත

**අවසානය**

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදීන්ටත් ස්තුතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 2.40 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති
රඹුක්කන ප්‍රාදේශීය සභාව

**සංශෝධන**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පිටු අංක 25 සඳහන් පරිදි තමා සභාගර්භයෙන් නික්ම ගිය බවත්, නමුත් ඒ මොහොතේ තමාගේ යෝජනා ඊළඟ සභාවරයට ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලූ බව සඳහන් වී නොමැති බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

පිටු අංක 27 සඳහන් පරිදි න්‍යාය පත්‍රය පෙළ ගැස්වීමේ දී ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී. තෙන්නකෝන් මැතිතුමාගේ යෝජනාව ඊළඟ සභාවාරයට ඉදිරිපත් කිරීම සුදුසු බව යෝජනා කළ අතර එය සටහන් වුවද තමාගේ නම එම ප්‍රකාශයට යෙදිම සුදුසු බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පිටු අංක 23 ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමාගේ මහීපාල හේරත් ක්‍රීඩාංගනයේ නාමය වෙනස් කිරීම සම්බන්ධ යෝජනාවේදී තමා විසින් දැක්වූ අදහස් සටහන් වී නොමැති බවත්, එහිදී ගරු මහීපාල හේරත් ඇමැතිතුමන්ගේ සමාජ මෙහෙවර ගැන විස්තරයක් ඉදිරිපත් කළ බවත්, ගරු උපසභාපතිතුමන්ගේ අදහස් දැක්වීම පැහැදිලිව සටන්ව ඇති බවත්, සභා අවස්ථා පටිගතවීමේ ගැටළුව තවම පවතින බවත්, එය හැකි ඉක්මනින් නිරාකරණය කළ යුතු බවත්, යම් පුද්ගලය ප්‍රතිරූපය ඉස්මතු කිරීමේ කුමන්ත්‍රණයක් පවතී යන්න හැඟෙන බවත්, අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීමේ සාරාංශ පමණක් දැකිය හැකි බවත් සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදී.

2026.04.07 දින මාසික මහසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

සත්‍ය පිටපතකි.

ආර්.එම්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.